# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 මාර්තු 05වන අඟහරුවාදා**
2013 மார்ச் 05 செவ்வாய்க்கிழமை
Tuesday 05th March 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.44 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.44க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.44a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. பிரதி தவிசாளர் [ ரஞ்ஜித் சோமவங்ச அவர்கள் ] தலைமை வகித்தார்.*
*Hon. Deputy Chairman [ Mr. Ranjith Somawansha ] in the Chair*

## කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

2013.02.19 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs) [On Behalf of the Chief Minister ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2006 වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාව"* මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
PETITIONS

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැඩිගමුව, ලෙනගල, වාසනා මාවත, අංක 234/4 හි පදිංචි එම්.ජී. සෝමපාල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බුලත්සිංහල, රජයේ සේවක ගම්මානය, අංක 48 හි පදිංචි එච්.ඒ. පද්මසිරි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවේ එහා පැත්තේ අපේ කණ්ඩායම් රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ කිත්සිරි ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා මගේ බෙල්ලෙන් අල්ලලා තල්ලු කරලා මේ සභා පරිශ්‍රයේදී මට මරණීය තර්ජන එල්ල කළා. මේ සභාවේ වගකීමකින් කටයුතු කරන කෙනෙක් හැටියට ඔබතුමා ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා මට මරණීය තර්ජන එල්ල කිරීම පිළිබඳව කරුණු සොයා බලන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු කිත්සිරි ප්‍රනාන්දු**
Hon. Kithsiri Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ලැජ්ජ වෙනවා, එතුමා එලෙස චෝදනා කිරීම ගැන. මම එහෙම කළේ නැහැ. එතුමයි අම්මා මතක් කරගෙන මට ගහන්න පැන්නේ. ඒ කාරණාව මම ප්‍රතික්ෂේප කරනවා. ඒක Group Meeting එකේදී වුණු දෙයක්. සභාවේදී වුණු දෙයක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය අපි ගරු සභාපතිතුමා වෙත යොමු කර ඉතාම කඩිනමින් මේ සම්බන්ධව විසඳුමකට යමුයි කියලා තමයි මූලාසනය හැටියට යෝජනා කරන්නේ. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලා පුද්ගලිකව නීතිමය වශයෙන් යම් යම් කරුණු කාරණා පිළිබඳව දැනුවත් වෙලා තිබෙනවා කියලා මම දන්නවා. ඒ සම්බන්ධවත් කටයුතු කිරීමේ අවස්ථාව තිබෙනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ පළාත් සභාවෙන් පවත්වාගෙන යන මීරිගම රජයේ රෝහලේ

ඉතාමත් ශෝචනීය අවස්ථාවක් සිදු වුණා. මොකද, දැන් සතියකට ප්‍රථමයෙන් අවුරුදු 13 ක කුඩා දරුවෙක් පිච්චිලා ගෙදර ඉඳලා මවත් එක්ක කථා කරමින් ගිහිල්ලා, ඊට පස්සේ ඉස්පිරිතාලෙටත් ගිහිල්ලා ඉඳගෙන දොස්තරත් එක්කත් කථා කළාට පස්සේ ඒ වෛද්‍යවරයාට උවමනා වුණා ඒ දරුවාව වතුපිටිවල රෝහලට යවන්න. ඒත් ඒ වෙලාවේ Ambulance එක රෝහලේ තිබිලා නැහැ. දෙමව්පියෝ ඉල්ලීමක් කරලා තිබෙනවා කොහොම හරි ළමයාව වතුපිටිවල රෝහලට ගෙනියන්න කියලා. ඒ වෙලාවේ Ambulance එකක් බලලා ප්‍රමාද වීම නිසා, පෞද්ගලික වාහනයක හරි ගෙනියන්න ඉල්ලීමක් කරද්දී එය ප්‍රතික්ෂේප කරද්දිත් දෙමව්පියෝ බලෙන් ඒ ළමයාව වතුපිටිවල රෝහලට ගෙනිහිල්ලා තිබෙනවා. ඒ ගෙනිහිල්ලා ටික වේලාවකින් ඒ ළමයා අන්තරා වුණා. විශේෂයෙන්ම මේ වාගේ තවත් කරුණක් වුණා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ පියෙකුට පපුවේ අමාරුවක් හැදිලා අසාධ්‍ය වෙලා රෝහලට ගෙන ගිය වෙලාවේදී Ambulance එක එළවන රියැදුරු නිවාඩු ගිය නිසා Ambulance එක අරගෙන යන්න කවුරුත් ඉඳලා නැහැ. ඒ උඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ පියාත් ඒ රෝහලේදීම අන්තරා වුණා. ඒ නිසා විශේෂයෙන්ම මම ඉල්ලීමක් කරන්නේ, Ambulance එකේ රියැදුරු මහතා නිවාඩු යනවා නම් ගරු සෞඛ්‍ය ඇමැතිතුමනි, ඒ වෙනුවෙන් කවුරු හරි යොදවන්න. ඒ වාගේම නිතරම Ambulance එකක් තිබුණොත් හොඳයි. මොකද, මීරිගම ආසනය කිව්වාම 156,000 කට වැඩි ජනගහනයක් ඉන්නවා. ඒ වාගේම හැමදාම විශාල සංඛ්‍යාවක් ඒ රෝහලට එනවා. Ambulance එක නැති වුණොත් මේ වාගේ විශාල ජීවිත හානි සිදු වෙන්න පුළුවන්. ඒක මහ හරවා ගත යුතුයි. මොකද, කුඩා දරුවෙක් කිව්වාම ඇත්ත වශයෙන්ම ඒ දරුවා කනන්ගමුව මහ විද්‍යාලයේ ක්‍රීඩාවට ඉතා දක්ෂ කුඩා දරුවෙක්. ඉතාමත් ශෝචනීයයි. වහාම පරීක්ෂණයක් පවත්වලා විසඳලා දුන්නොත් හොඳයි කියලා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ මෑතකදීත් මීරිගම රෝහලේ ස්ථානගත පරීක්ෂණයක් කළා. දැනට තිබෙන Ambulance එක පිටස්තර රාජකාරියේ යෙදුණු අවස්ථාවක වෙන්න ඇති ඔය කාරණාව සිද්ධ වෙන්න ඇත්තේ. ඒ පිළිබඳව සොයා බලා පරීක්ෂණයක් කරන්න පුළුවන්. මේ වර්ෂය වනකොට අපි තවත් හදිසි ගිලන් රථ 10 ක් සහ මධ්‍යම රජය යටතේ ගිලන් රථ 20 ක් අපේක්ෂා කරනවා. අපේ සේවාවලට ඇතුළත් කරන්න. මම හිතන්නේ දැනට ශ්‍රේණිගත කිරීම්වලට අනුව රෝහල්වලට සපයන්න පුළුවන් ප්‍රමාණයට ඒවා සපයලා තිබෙනවා. අනෙක් එක අපි දැනුම් දීලා තිබෙනවා, ගිලන් රථ රියැදුරන් වෙනුවට ආදේශක ගිලන් රථ රියැදුරෙක් අපේ ස්ථානභාර වෛද්‍ය නිලධාරීවරුන්ට තියා ගන්න පුළුවන් කියලා. නිත්‍ය රියැදුරා යම් විධියකින් නිවාඩු ලබනවා නම් හෝ වෙනත් කටයුත්තක යෙදෙනවා නම් ඒ අවස්ථාවට යොදා ගන්න අවශ්‍ය බලය අපි පවරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ ගරු ඇමැතිතුමා විශේෂ පරීක්ෂණයක් ආරම්භ කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා සෑහීමකට පත් වේවි කියලා හිතනවා. ඔබතුමාටත් පුළුවන් ඒ සම්බන්ධව ගරු ඇමැතිතුමාත් සමග සම්බන්ධ වෙලා කටයුතු කරන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

බොහොම ස්තුතියි. ඒ සඳහා තවත් ගිලන් රථයක් ලබා දුන්නොත් හොඳයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකයි ඕනෑ වෙලා තිබෙන්නේ.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

## පළාතේ පාසැල් පරීක්ෂා කිරීම සඳහා විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් පත්කිරීම
APPOINTING A SPECIAL INSPECTION TEAM TO INSPECT SCHOOLS OF THE PROVINCE

**01.**

**යූ. ජොර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

අ. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ බස්නාහිර පළාතේ පාසැල් පරීක්ෂා කිරීම සඳහා විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් ක්‍රියාත්මක වන බව පිළිගන්නේද?

ආ. එම පරීක්ෂණ කණ්ඩායම 2012 වසර තුළ කැලණිය අධ්‍යාපන කලාපයේ පාසැල් පරීක්ෂා කළේද?

ඇ. එසේනම් ඒ කුමන පාසැල් දැයි නම් කළ හැකිද?

ඈ. එසේ පාසැල් පරීක්ෂා කරන ලද දිනයන් හා පාසැල් වල නම් සඳහන් කරන්නේද?

ඉ. එම පරීක්ෂණ කණ්ඩායම්වල නිලධාරීන්ගේ නම් හා තනතුරු සඳහන් කරන්නේද?

ඊ. එම පරීක්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳ සාරාංශ වාර්තාවක් ලබා දෙන්නේද?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්.

**ඇමුණුම 01 :**

| | |
|---|---|
| කැළ/ජනාධිපති වි. මහර, | කැළ/නෙළුම්වැස්ස වි. |
| කැළ/සා පාවුළු බාලිකා වි. | කැළ/මහමායා බා.වි. |

ඈ. ඔව්.

| | |
|---|---|
| කැළ/අල්මුස්තෆා වි. | කැළ/හුණුපිටිය සහිරා වි. |
| කැළ/යටිහේන ප්‍රා.වි. | කැළ/ශාන්ත මරියා වි. |
| කැළ/යටිහේන මුස්ලිම් වි. | කැළ/බියගම ම.ම.වි. |
| කැළ/පිලපිටිය ජනාධිපති වි. | කැළ/හුණුපිටිය බණ්ඩාරනායක ම.වි. |
| කැළ/වැලිපිල්ලෑව ප්‍රා. වි. | කැළ/හේනෙගම ම.ම.වි. |
| කැළ/ජයකොඩි ම.වි. | කැළ/දරනගම වි. |
| කැළ/රාහුල කණිටු වි. | කැළ/කිරිල්ලවල ම.වි. |
| කැළ/විශාකා බාලිකා වි. | |

**ඇමුණුම 02 :**

| පාසලේ නම | පරීක්ෂා කරන ලද දිනයන් |
|---|---|
| කැළ/මහර ජනාධිපති විද්‍යාලය | 2012.02.23/2012.03.06/2012.03.26/2012.03.29<br>2012.03.30/2012.12.21 |
| කැළ/රාහුල කණිටු විදුහල | 2012.12.06 |
| කැළ/ජයකොඩි මහ විද්‍යාලය - වැලිපිල්ලෑව | 2012.05.25 |
| කැළ/වැලිපිල්ලෑව ප්‍රාථමික විද්‍යාලය | 2012.02.06/2012.03.09 |
| කැළ/විශාකා බා. විද්‍යාලය - සපුගස්කන්ද | 2012.03.16 |
| කාළ/ශාන්ත පාවුළු බා. විද්‍යාලය | 2012.02.14/2012.02.17 |
| කැළ/හුණුපිටිය සහිරා ම. විද්‍යාලය | 2012.05.03/2012.05.12/2012.05.25/2012.05.30/2012.06.25<br>2012.07.10/2012.07.16/2012.07.26/2012.07.27<br>2012.08.06/2012.10.19 |
| කැළ/ජනාධිපති විද්‍යාලය - පිලපිටිය | 212.03.29/2012.03.30/2012.05.14/2012.09.06/2012.10.04/2012.10.<br>08/2012.11.05/2012.11.08/2012.11.12/2012.11.15<br>2012.11.19/2012.11.22/2012.11.23/2012.11.29/2013.01.04<br>2013.01.07/2012.01.10/2013/01.28/2013.01.31 |
| කැළ/මහමායා බා. විදහාලය | 2012.02.16/2012.02.17/2012.02.20/2012.02.21/2012.02.23<br>2012.02.28/2012.03.01/2012.05.18/2012.05.25/2012.05.28<br>2012.06.18/2012.06.25/2012.06.28 |
| කැළ/ශාන්ත මරියා විද්‍යාලය - වත්තල | 2012.06.01 |
| කැළ/හේනේගම ම.ම. විද්‍යාලය | 2012.06.10/2012.06.19/2012.06.22 |
| කැළ/බියගම ම.ම. විද්‍යාලය | 2012.09.24/2012.09.25/2012.10.01/2012.10.02/2012.10.04<br>2012.10.18/2012.10.22 |
| කැළ/හුණුපිටිය බණ්ඩාරනායක ම. විද්‍යාලය | 2012.12.06/2012.12.07/2012.12.24/2013.01.07/2013.01.10 |
| කැළ/යටිහේන ප්‍රාථමික විද්‍යාලය | 2012.01.16/2012.01.17/2012.01.26/2012.01.27/2012.04.20<br>2012.04.30/2012.10.16/2012.11.02/2012.11.03/2012.11.16 |
| කැළ/අල්මුස්තාෆා විද්‍යාලය | 2012.05.25 |
| කැළ/නෙළුම්වැස්ස විද්‍යාලය - රන්මුතුගල | 2012.02.10/2012.02.13/2012.03.06 |

| | |
|---|---|
| කැළ/දරණගම විද්‍යාලය | 2012.06.14/2012.06.14 |
| කැළ/යටිහේන මුස්ලිම් විද්‍යාලය | 2012.04.20/2012.04.30/2012.10.16/2012.11.16 |
| කැළ/කිරිල්ලවල ම. විද්‍යාලය | 2012.02.13/2012.05.10 |

ඉ. ඔව්.

ඇමුණුම 03 :

පරීක්ෂණ කණ්ඩායම්වල නිලධාරීන්ගේ නම් හා තනතුරු

| | | |
|---|---|---|
| බී. කුමාරසිංහ මයා | - | අධ්‍යක්ෂ විමර්ශන |
| ජී.ඒ. විමලරත්න මයා | - | ස.අධ්‍යක්ෂ විමර්ශන |
| ජේ.යූ.එම්.බී. උඩයාර් මයා | - | විමර්ශන නිලධාරී |
| ඩී. රංජිත් ප්‍රේමසිරි මයා | - | විමර්ශන නිලධාරී |
| ඒ.ඒ. ගුණවර්ධන මයා | - | විමර්ශන නිලධාරී |
| ආර්.ඒ.ජේ. රත්නායක මයා | - | විමර්ශන නිලධාරී |
| එස්.එන්.ජී.එච්.ඩබ්. ඩයස් මයා | - | විමර්ශන නිලධාරී |
| ඒ.එස්.එම්. නස්ලම් මයා | - | විමර්ශන නිලධාරී |
| එල්.පී. මෙන්ඩිස් මයා | - | විමර්ශන නිලධාරී |
| ජී.ඒ. එදිරිසිංහ මයා | - | විමර්ශන නිලධාරී |

ඊ. ඔව්.

ඇමුණුම 04 :

| | |
|---|---|
| කැළ/ජනාධිපති වි. මහර | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |
| කැළ/සා පාවුළු බාලිකා වි. | අවවාද ලිපි නිකුත් කර ඇත. |
| කැළ/අල්මුස්තෆා වි. | අවවාද ලිපි නිකුත් කර ඇත. |
| කැළ/යටිහේන ප්‍රා.වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/යටිහේන මුස්ලිම් වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/පිලපිටිය ජනාධිපති වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/වැලිපිල්ලෑව ප්‍රා. වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/ජයකොඩි ම.වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පව |
| කැළ/රාහුල කණිටු වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |
| කැළ/විශාකා බාලිකා වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පව |
| කැළ/නෙළුම්වැස්ස වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/මහමායා බා.වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/හුණුපිටිය සහිරා වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |
| කැළ/ශාන්ත මරියා වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |
| කැළ/බියගම ම.ම.වි. | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/හුණුපිටිය බණ්ඩාරනායක ම.වි. - | වාර්තාව ලේකම්ට භාර දී ඇත. |
| කැළ/හේනෙගම ම.ම.වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |
| කැළ/දරනගම වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |
| කැළ/කිරිල්ලවල ම.වි. | ඉදිරි විමර්ශන සිදු කරමින් පවතී. |

***[සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්න]***

*[Questions asked at the time of adjournment of the Council]*

# අධ්‍යාපන දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද මුදල් - 2012

MONEY ALLOCATED TO THE EDUCATION DEPARTMENT - 2012

**02.**

**ඊ. සිරිකමල් පිලීපියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය :**

අ. බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත 2012 වසරේ පළාත් සභා මගින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද?

ආ. එම මුදල් ප්‍රමාණය වෙන් කරන ලද්දේ කුමන ආකාරයකටද?

ඇ. (i) භෞතික සම්පත් දියුණු කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද?

(ii) එම මුදල සම්පූර්ණයෙන් වැය කර තිබේද?

ඈ. (i) පළාත් සභා ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආකාරයකින් ප්‍රතිපාදන ලැබුණේද?

(ii) එසේ නම් ඒ කොපමණද?

(iii) ඒ කුමන මාර්ගවලින්ද?

ඉ. (i) 2013 වසරේදී අධ්‍යාපන විෂයය සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද?

(ii) භෞතික සම්පත් වැඩි දියුණු කිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද?

(iii) පළාත් සභා ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආකාරයෙන් මුදල් ලැබී තිබේද?

(iv) ඒ මොනවාද?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]

Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

අ.

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | - | රු.14,810,665,000.00 |
| මූලධන වියදම් | - | රු. 2,390,000.00 |
| ප්‍රාග්ධන වියදම් (භෞතික සම්පත් සංවර්ධනය සඳහා | - | රු. 1,101,839,482.00 |
| **මුළු මුදල** | | රු.15,580,624,022.00 |

ආ. උසස් ඉගෙනුම් අවකාශ (විද්‍යාගාර, පරිගණකාගාර, බහුකාර්යය ඒකක, පුස්තකාල ...)

ඉදිකිරීම්

අළුත්වැඩියා හා නඩත්තු

සැපයීම් (ලී බඩු හා ඉගෙනුම් උපකරණ)

ඇ. (i) රු. 1,101,839,482.00

(ii) වෙන් කරන ලද මුදලින් 91% ක් වියදම් කර ඇත.

ඈ. (i) ඔව්.

(ii) රු. මිලියන 490.0

(iv) උපමානපාදක විශේෂ ප්‍රදාන (අඩක් නිම කළ ගොඩනැගිලි සම්පූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් ප්‍රතිපාදන) - රු. මිලියන 400.0

ප්‍රාදේශීය අසමතුලිතතාවය අවම කිරීමේ අරමුදල (පාසල් වර්ණාලේප කිරීම සඳහා ලබා දුන් ප්‍රතිපාදන) - රු. මිලියන 90.0

ඉ. (i)

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | - | රු.15,948,687,000.00 |
| මූලධන වියදම් | - | රු. 3,450,000.00 |
| ප්‍රාග්ධන වියදම් (භෞතික සම්පත් සංවර්ධනය සඳහා | - | රු. 737,000,000.00 |
| **මුළු මුදල** | | රු.16,689,137,000.00 |

(ii) රු. මිලියන 737.0

(iii) ඔව්.

(iv) ලෝක බැංකු අරමුදල රු. මිලියන 245.0 (ඉහත (ඉ) (ii) පිළිතුරෙහි මෙම මුදල ඇතුළත්ය)

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඔබතුමාට පිළිතුරු දෙන්න පුළුවන්කම තිබෙනවාද? දැන් මේ අනුව 2012 වර්ෂයට වඩා 2013 වර්ෂයේදී භෞතික සම්පත් වැඩිදියුණු කිරීම සඳහා පැහැදිලිවම අඩු වීමක් තිබෙනවා. වෙන් කරලා තිබෙන මුදල. හරි නම් සාමාන්‍යයෙන් වැඩි වීමක් නේ වෙන්න ඕනැ. මේ අවුරුද්දේ පැහැදිලිවම අඩු වීමක් තිබෙන්නේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

ප්‍රාග්ධන ආයෝජනද?

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මේ පිළිබඳව අයවැය විවාදයේදී අපි පූර්ණ සාකච්ඡාවට භාජනය කළා. ඒ නිසා ඒක සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් නැහැයි කියලා අපි හිතනවා. මේ පිළිබඳව විෂයානුකූලව කථා කළා නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් මේ සභාවේ ඇමැතිවරු කී දෙනෙක් ඉන්නවාද? මීට අමතරව ඇමැති ධුර පත් කරලා තිබෙනවාද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට තේරෙන්නේ නැහැ කවදා මේවා ඉගෙන ගනීද කියලා. එපමණයි මගේ උත්තරය.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මුදල් විශ්ලේෂණය පිළිබඳව මම ගැඹුරින් යම්කිසි දෙයක් පැහැදිලි කිරීමක් කරන්න -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මේකේ මිලියන 90 ක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මම මූලාසනය හැටියට මතක් කරන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමා වෙතම යොමු වුණා නම් වඩා නිවැරැදියි. ප්‍රධාන ඇමැතිතුමා වෙනුවෙන් නේ මෙතුමා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක තමයි මම මෙතුමාගෙන් ඉස්සෙල්ලා ඇහුවේ උත්තර දීමේ හැකියාවක් තිබෙනවාද කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා සෑහීමට පත් වන උත්තරයක් ඇමැතිතුමා දේවි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

මම විශ්වාස කරන විධියට ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ මුදල් මෙම වසරේදී පුනරාවර්තන සහ ප්‍රාග්ධන ආයෝජන වශයෙන් වෙන් කර ඇති ආකාරයත්, වෙනත් ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණයත් පිළිබඳව මට අවබෝධයක් නැහැ. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින්ම ඒ සඳහා පිළිතුරු -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා සහතික වෙනවාද ලබන සැරේදී ඒ ප්‍රශ්නයට විතරක් උත්තර දෙන්න.

# 2012 වසරේ පළාතේ පාසල්වල තීන්ත ආලේප කිරීම

APPLYING PAINTING TO SCHOOLS OF THE PROVINCE IN YEAR 2012

**03.**

**ඊ. සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය :**

අ. 2012 වසරේ බස්නාහිර පළාතේ පාසල්වල තීන්ත ආලේප කිරීම සඳහා වියදම් කළ මුදල කොපමණද?

ආ. එම මුදල් ලබා දෙන ලද්දේ කුමන වැඩ සටහන් යටතේද?

ඇ. පළාතේ පාසල් කොපමණ සංඛ්‍යාවක් සඳහා මෙම මුදල් ලබා දුන්නේද?

ඈ. ලබා දුන් මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩිපුර මුදල් අය කිරීමට බලධාරීන් වෙත උපදෙස් හෝ බලය ලබා දී තිබුණේද?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

අ. රු. මිලියන 94,050,000.00

ආ. පාසල් වර්ණාලේප හා සුළු අළුත්වැඩියා වැඩ සටහන යටතේ මුදල් මූලාශ්‍ර 3 කින් මේ සඳහා මුදල් ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | - | රු.මි. 89,000,000.00 |
| පොදු අරමුදල | - | රු. මි. 4,050,000.00 |
| පළාත් සංවර්ධන ප්‍රදාන | - | රු.මි. 100,000.00 |

ඇ. පාසල් 1273 ක් සඳහා.

ඈ. නැත.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. එතුමා පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු දුන්නා රුපියල් මිලියන 94,050,000.00 වැය කරලා තිබෙනවා කියලා. ඊට පස්සේ අවසාන ප්‍රශ්නයට උත්තර දුන්නා, එහෙම පිටින් මුදල් එකතු කිරීමේ බලයක් පවරලා තිබුණේ නැහැයි කියලා. නමුත් පසුගිය දවස්වල හොරණ පාසල් ශිෂ්‍යාව සම්බන්ධව ඇති වුණු සිද්ධියේදී ජනමාධ්‍යයෙන් අපට දැන ගන්න ලැබුණේ, පාසල්වල තීන්ත ගාන්න මේ වෙන් කරපු මුදල ප්‍රමාණවත් නොවන නිසා විවිධ මාර්ගවලින් මේ මුදල එකතු කරන්න කියලා උපදෙස් දීලා තිබුණු බවයි. ඇත්ත වශයෙන්ම ඒ වැඩ සටහන හොඳයි. නමුත් යම් යම් පාසල්වලට තීන්ත ගාන්න ප්‍රමාණවත් වුණේ නැහැ. එතකොට මෙතැනදී දෙන උත්තරයේ පරස්පරයක් තිබෙනවා. පැහැදිලිවම පරස්පරයක් තිබෙනවා. මම දන්නේ නැහැ, මේකේ කවුද ඇත්ත කියන්නේ, කවුද බොරු කියන්නේ කියලා. මෙය මේ රටේ විශාල ආන්දෝලනාත්මක ප්‍රශ්නයක් වුණා. ඒ නිසයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කෙරුවෙත්.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni de Soysa

සිරිකොත අලුත්වැඩියා කරන්නත් සල්ලි වෙන් කළා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මට සෘජුව දැන ගන්න ඕනෑ, මේ පළාත් සභාව හරහා වෙන් කරන ලද මුදලට අමතරව මේ තීන්ත ආලේප කිරීම සඳහා මුදල් එකතු කිරීමට පාසල්වලට අවසර දීලා තිබුණාද නැද්ද? එපමණයි මට දැන ගන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මෛත්‍රීපාල ගැන කනගාටු වෙනවා.

**ගරු යූ. ජෝර්  පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]**
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්  පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

රොටියා ඉඳගන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම ඉඳගන්නේ නැත්තේ මේ රොටියාට ඉඳගන්න කියනවා. මම ඉඳ ගත්තොත් රොටියා වෙනවා. ඒකයි මම ඉඳ ගන්නේ නැත්තේ. ඔබතුමාට පැහැදිලිද දන්නේ නැහැ මම අහපු ප්‍රශ්නය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්න අසන අවස්ථාවේදී පිළිතුරු සපයන්න ගරු වැඩ බලන ප්‍රධාන ඇමැතිතුමාට ඉඩකඩ දෙන්න.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]**
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා මෙම මුදල් වර්ණාලේප කිරීමේ ව්‍යාපෘති සඳහා වෙන් කළේ, අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන ව්‍යාපෘතිය යටතේ. එම ව්‍යාපෘතිය සම්බන්ධව මූලික අධ්‍යයනයකින් තොරව ක්‍රියාත්මක වීම නිසා වුණු අඩුපාඩුවක් ඇරෙන්න මෙහිදී දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීමේ ක්‍රියාවලියකට යෙදෙන්න ගරු ප්‍රධාන ඇමැතිතුමා කිසිසේත් යොමු කිරීමක් කර තිබුණේ නැහැ. දැන් මෙහිදී අපි මූලික වශයෙන් අදහස් කළේ, පාසලක දෛනික අවශ්‍යතාවයන් පදනම් කරගෙන එහි සිදු වන කුඩා කැඩීම් බිඳීම් සහ එහෙම නැත්නම් දුර්වර්ණ වී ඇති ශාලාවන් වර්ණාලේප කිරීමේ කටයුත්තක් කරන්න. එහිදී පාසලේ මෙවැනි අවශ්‍යතාවයන් පිළිබඳව හඳුනාගෙන දෙමව්පියන්ට, ප්‍රදේශයේ සුහපතන්නන්ට, ආදී ශිෂ්‍ය සංගමයට ආදී වශයෙන් විවිධ අනුබද්ධ සංවිධානවලට ඒ පිළිබඳව දැනුම් දීමෙන් පසු ඒ සංවිධාන එකට එකතු වෙලා, පාසලක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් හැටියට තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ. එසේ නැත්නම් දෙමව්පියන්ගෙන් පෞද්ගලිකව මුදල් එකතු කරලා ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් හැටියට නොවෙයි, අපේ පාසල අපේ දැතින් සුරකිමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ. මේ පිළිබඳව යම් යම් අය තමන්ට තිබෙන අවබෝධය තුළ ක්‍රියාත්මක වීම නිසා යම් යම් තැන්වලට අර්බුද ඇති වී තිබෙන බව පසුකාලීනව එතුමාට දැනගන්න ලැබුණු බව පැවසුවා. නමුත් මේ පිළිබඳව ප්‍රධාන අමාත්‍යාංශයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිදු නියෝගයක් නැහැ, කිසිම විදුහල්පතිවරයෙකුට, දරුවන් මගින් මුදල් එකතු කරලා මේ ක්‍රියාවලිය සඳහා මුදල් යොමු කර ගන්න කියන එක. අඩුපාඩුවක් තිබෙනවා නම් මම හිතනවා ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒ පිළිබඳව පරීක්ෂණයක් කරලා අවශ්‍ය කටයුතු සිද්ධ කරාවි කියලා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අවසාන වශයෙන් ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. දැන් ඔබතුමාත් පිළිගත්තා. නියෝගයක් නිකුත් නොකළාට යම් යම් පාසල් ඒ ඉන්න සුහපතන්නන්ගෙන් එහෙම නැත්නම් වෙනත් මාර්ගවලින් මේ මුදල් එකතු කිරීමක් කළාය කියලා. පැහැදිලිවම මුදල් එකතු කිරීමක් කරලා තිබෙනවා, බස්නාහිර පළාතේ තිබෙන පාසල්වල බලධාරීන්. එතකොට ඒ පිළිබඳව යම්කිසි පරීක්ෂණයක් කරලා මේ සභාවට කරුණු -

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]**
Hon. Jagath Angage - Minister [On Behalf of the Chief Minister ]

මම හිතන්නේ දැනටමත් ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒ පිළිබඳව ක්‍රියා මාර්ගයක් රැගෙන තිබෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් වේලාව 10.07 යි. මට හරියටම විනාඩි පහක් දෙන්න. මොකද, බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මේ වනකොට තිබෙන ඉතාමත්ම කනගාටුදායක තත්ත්වය ඇත්තටම ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. සභා ගර්භයේදී ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට කම්කරුවෙක් එහෙම නැත්නම් රියැදුරෙක් ඇවිල්ලා ගහලා එළියට දාන්න පුළුවන් තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම දැන් ජනතාව නියෝජනය කරන අපේ සන්ධාන මන්ත්‍රීවරයෙක් හැටියට මේ පසුගිය සභාවේදී එතුමා ලොකු අපහසුතාවයකට පත් වුණා. ඊට පෙර අපේ මුස්ලිම් ජනතාව නියෝජනය කරන බදුර්දීන් මන්ත්‍රීතුමාට සෞඛ්‍ය කම්කරු ලාල් ප්‍රේමසිරි කියන අය බැණ වැදී මරණ තර්ජනය

කළා. සුළු පක්ෂ හැටියට මෙහෙම කරනකොට ඇත්තටම ඒක ඉදිරියට හොඳ ප්‍රතිඵලයක් නොවෙයි කියන එකයි මම මතක් කරන්නේ. ඒ නිසා මේ සභාපතිවරයා තනියම ගෙන යන වැඩ පිළිවෙළ ඉතාමත්ම වැරැදි සහගතයි කියන එක අද ඊයේ නොවෙයි මේ සියලු මන්ත්‍රී මණ්ඩලය 2011 හයවැනි මාසේ මුලින්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාට ලිඛිතව දන්වා තිබෙනවා. ඒ සියලු වාර්තා මම සභාගත කරනවා. ඒ වාගේම ඒ අක්‍රමිකතා සියලුම දේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රීඩාංගණය ඉදි කිරීම, හැගල්ල සති පොළ ඉදි කිරීම, දෙහිගාවෙල ආදාහනාගාරය ඉදි

[ ගරු ලලිත් වර්ණකුමාර ]

කිරීම, මීගහකුඹුර කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය ඒ (බාධා කිරීමක්) ඇත්තටම ඒ වාගේම සභාපතිවරයා තමන්ගේ අභිමතයට පමණක් ක්‍රියා කරන කෙනෙක්. මහජන පරමාධිපත්‍ය අනෙක් මන්ත්‍රීවරුන්ට ලැබෙන්නේ නැහැයි කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මොකද, සභාවට යෝජනාවක් ගෙනාවාම යෝජනාව සභාවට ලබලා දෙන්නේ නැහැ. පසුගිය කාලයේ මේ අර්බුදයට මුල් වුණෙත්, මත්පැන් හලක් නැවත විවෘත කරන්න යන එකට මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව සභාවට දැම්මේ නැහැ. පක්ෂ විපක්ෂ සියලු දෙනා විරුද්ධ වෙලා සභාපතිතුමාගේ තනි අභිමතයට සභාවට නොදා ඒක උඩුදුවලා ඒ අයට වාසි වුණාට පස්සේ සභාවට දාන වැඩ පිළිවෙළක් තමයි ගෙන ගියේ. ඒ තුළ තමයි මේ අර්බුදකාරීත්වය ගොඩ නැගෙන්නේ. ඒ නිසා ඒක අද ඊයේ නොවෙයි. 2011 ඉඳලාම ප්‍රධාන ඇමැතිතුමාගේ ඉඳලාම ඒ අදාළ සියලු දෙනාට දැනුවත් කරන්න, මන්ත්‍රී මණ්ඩලය අත්සන් කරලා, ලියලා, සීල් ගහලා හැම තැනටම බෙදලා තිබෙනවා. මම ඒ සියලුම වාර්තා සභාගත කරනවා. ඒ වාගේම ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ඉදි කරපු වැඩ පිළිවෙළ තුළ කම්බොක්කාව මාර්ගයට දීපු මුදල් - මම මේ කෙටියෙන් කියන්නේ. ඒකේ උපදේශක කාරක සභාවේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒ ලිපි ලේඛන සභාගත කරනවා නේද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ඔව්. සභාගත කරනවා.[1] මම කෙටියෙන් කියන්නේ. උපදේශක කාරක සභාවේ යෝජනා වෙලා තිබෙනවා ඒ පාරට වියදම් කළ මුදල් නැවත පවරා ගන්න. ඒ පාර ප්‍රයෝජනයට ගන්න බැරි ආකාරයට සම්මත කරලා තිබෙනවා. මොකද, MBRO පරීක්ෂණය, ඒ වාගේම අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි පරීක්ෂණ ඒවායේ නිර්දේශ කරලා තිබෙනවා, මේවා පාවිච්චියට ගන්න බැරි තත්ත්වයේ තිබෙන්නේ කියලා. ඒ නිසා ඒ තුළ සිමෙන්ති කොහොමද දාලා තිබෙන්නේ. මේවායේ දූර කොහොමද? ඒ සියල්ල මේ අවස්ථාවේදී සභාගත කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරන්නේ, විශේෂයෙන්ම මේ ඊයේ පෙරේදා 2013.02.21 දා මන්ත්‍රීවරු හත් දෙනෙක් අත්සන් කරලා ලේකම්තුමියගෙනුත්, කම්කරුවන්ගෙනුත් මේ මන්ත්‍රීවරුන්ට වන අසාධාරණය පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා මේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ සුළු පක්ෂයේ මන්ත්‍රීවරු දෙපළට වුණු අසාධාරණය පිළිබඳව සොයා බලලා කටයුතු කරන්න කියන එක මම ගරු ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ සියලුම ලේඛන සභාගත කරනවා. මේ වනකොට මේ සභාව මුදල් කමිටුවක් නැතුව, කිසිම අනුමැතියක් නැතුව මාස තුනක් තිස්සේ යන්නේ කොහොමද කියන එක ලොකු ගැටළුවක් වෙලා තිබෙනවා. කොමසාරිස්තුමියගෙන් මමත් ප්‍රශ්න කළ අවස්ථාවේදී එතුමිය උපදෙස් දෙන්නම් කිව්වා. නමුත් මුදල් කමිටුවක් අනුමත නොකර යන වැඩ පිළිවෙළ කොහොමද කියලා අපි දන්නේ නැහැ. මාස තුනක් තිස්සේ කොයි ආකාරයෙන්ද කියලා. ඒ නිසා මහ අවුලෙන් අවුලට පත් වෙලා, ප්‍රාදේශීය සභාවෙන් විය යුතු දේවල් නොවී, මේ අවුරුද්ද පුරා මනාප වෙනුවෙන් විය යුතු දේවල් විතරයි හැමදාම වෙන්නේ. ඇසළ උදානය කියනවා. සූර්ය මංගල්‍යය කියනවා. ඒ ආකාරයට සැණකෙළි කියයි. එහෙම නැත්නම් සංගීත සංදර්ශන කියයි. මම හිතන්නේ, අවුරුදු හයක් තිස්සේ පාරක කම්කරුවෙක් කාණුවක් කපපු තැනක් නැහැ. මේ ප්‍රාදේශීය සභාවෙන් පාරවල් දෙපැත්තේ එළි කරපු තැනක් නැහැ. ඒ කම්කරුවෝ කවුද කියන එකවත් සභාවේ මන්ත්‍රීවරු දන්නේ නැහැ. සියලුම දෙනා ඉන්නේ නිලධාරීන් වාගේ. ඒ තනතුරට වැඩ කරන්න කිසිම කෙනෙක් යොදවලා නැහැ. ඒ අදාළ තනතුරුවලට යොදවලා නැහැයි කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමා මේ ස්ථානයේ සිටීම පිළිබඳව මම ඇත්තෙන්ම සන්තෝෂයට පත් වෙනවා. විශේෂයෙන්ම සමූපකාර සේවක කොමිෂන් සභාව තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව තුළ. මේ පළාත තුළ සමූපකාර සේවයේ යෙදෙන සේවක මහත්මයෙකුට හෝ මහත්මියෙකුට යම් අසාධාරණයක් වුණාම ඒ අසාධාරණය සමිතියෙන් සිද්ධ වුණාද? නිලධාරියෙකුගෙන් සිද්ධ වුණාද? සේවකයාගේ සේව්‍ය තත්ත්වය පිළිබඳව කල්පනා කරලා බලලා එය නිවැරැදි කිරීමට උත්සාහ ගන්න ආයතනයක් තමයි බස්නාහිර පළාතේ සමූපකාර සේවක කොමිෂන් සභාව. අද බස්නාහිර පළාතේ සමූපකාර සේවක කොමිෂන් සභාව කියලා කියන්නේ, බොහෝ තැන්වලදී අපි දැකලා තිබෙන්නේ සමූපකාර සේවකයන්ගෙන් පලි ගන්න ආයතනයක් බවට පත් වෙලා තිබීමයි. උදාහරණයක් විදියට යම් නිලධාරියෙකුට විරුද්ධව, යම් සභාපතිවරයෙකුට විරුද්ධව, යම් සේවකයෙක් පැමිණිල්ලක් ඉදිරිපත් කළාම ඒ පැමිණිල්ලට අනුව

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

පන්න පන්න පස්සේ එළවමින් නැවත ඒ සේවකයාට පහර දෙන තත්ත්වයක් තමයි අදාළ ආයතන හරහා සමූපකාර සේවක කොමිෂන් සභාව කරන්නේ. අපි දන්නවා. ඒකේ ඇමැතිවරයා පත් කරන සභාපතිවරයෙක් තමයි ඉන්නේ. නමුත් අපි දන්නවා. එතුමා මේ ආයතනයේ සභාපතිවරයා හැටියට පත් වුණාම බොහොම නිවැරැදිව කටයුතු කිරීමේ හැකියාවක්, හැඟීමක් තිබෙන්නට ඕනෑ. මම හිතන්නේ අද රාජ්‍ය සේවය තුළ අඩුම වැටුප් ලබා ගන්නා සේවකයෙක් ඉන්නවා නම් ඒ සමූපකාර සේවකයයි කියන එක අපි මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ. ඒ නිසා එක පැත්තකින් මම කොලොන්නාවේ සමූපකාර නිලධාරිනියෙකුට වුණු - සුදුසුකම් අනුව උසස්වීම් දීමේදී වුණු අසාධාරණයක් පිළිබඳව මේ සභාවේ පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කළාම ඒ පිළිබඳව විමර්ශනය කරලා, ඒ පිළිබඳව සාධාරණ තත්ත්වයට පත් කරන්න කියලා පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාව හරහා කියද්දී, අද සමූපකාර සමිතිය හරහා මේ සේවිකාවගෙන් පළිගැනීමේ තත්ත්වයක් තමයි නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි මතක් කරන්නේ, මේ තත්ත්වය තුළ සමූපකාර ආයතනය, සමූපකාර ව්‍යාපාරය ඉතාම නිර්ලජ්ජිත විධියට පල්ලෙහා මට්ටමට පත් කරනවා, සමූපකාර සේවක කොමිෂන් සභාව ඇතුළු වගකිව යුතු අය. මේකට සම්පූර්ණයෙන්ම සමූපකාර කොමසාරිස්වරයා වගකිවයුතු තැනකට ඇවිල්ලා තිබෙනවා. මම මේ පිළිබඳව කීප පාරක් කථා කරලා සමූපකාර කොමසාරිස්වරයාට කිව්වා. එතකොට කියනවා, අනේ මට බලයක් නැහැ. මට කරන්න විධියක් නැහැ. මට බලයක් නැහැයි කියලා. හැබැයි බලය තිබෙනවා, එයාට ඕනෑ විධියට කරන්න. දූෂිත සභාපතිවරු ආරක්ෂා කරන්න. දූෂිත සභාපතිවරු එක්ක විවිධ විදේශ සංචාර යන්න. ලෝකය වටේ යන්න. එහෙම නැත්නම් සමූපකාර සේවකයෝ කියන විධියටම විවිධ වරදාන, වරප්‍රසාද ලබා ගන්න. මේවාට ඔහුට පුළුවන්කමක් තිබුණත්, අසරණ සමූපකාර සේවකයෙක් අසරණයට ලක් වුණු වේලාවක මේ කොන්ද පණ නැති කොමසාරිස්වරු පතෝල වාගේ ඉඳගෙන තමන්ට වාසි ලැබෙන පැත්ත දිහා බලනවා මිසක් අහිංසක සේවකයා දිහා නොබලන තත්ත්වයකට පත් වෙමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ නිසා අපි ඉල්ලීමක් කරන්නේ. යම් පෙත්සම් කාරක සභාවකට පෙත්සමක් ඉදිරිපත් කළාම, ඒ පෙත්සම විභාග වන කොට ඒ විභාග වන කාලපරිච්ඡේදය තුළම අදාළ සේවකයාට විරුද්ධව මෙවැනි කටයුතු කෙරෙනවා නම්, මෙවැනි දුර්දාන්ත තත්ත්වයන්ට පත් වෙනවා නම් ඒ වාගේම මේ සභාවේ පෙත්සම් කාරක සභාවේ තිබෙන ශක්තියත් හීන කරලා, දුර්වල කරලා ඒ අසාධාරණයට ලක් වෙන අයට සාධාරණය ඉෂ්ට කරන්න මේ සභාව ගන්න වෑයමටත් විරෝධාකල්පයක් තමයි ඇති වන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි දූෂිතයන් ආරක්ෂා කරනවා වෙනුවට මෙවැනි දූෂිතයන් පළවා හැරීමේ තැනකට අපි පත් වෙන්නට ඕනෑය කියන එක මතක් කරමින් මම මේ අවස්ථාවේදී නිහඬ වෙනවා.

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න, සභාව නොමඟට ඇරලා අපේ ගරු විපක්ෂ නායකතුමා කථා කිරීම සම්බන්ධව කරුණු පැහැදිලි කිරීමක් කරන්න. දැන් අපේ කොමසාරිස්වරයාට චෝදනාවක් ඉදිරිපත් කළා, සමූපකාර සේවක කොමිෂන් සභාවටත් චෝදනාවක් ඉදිරිපත් කළා, මෙතුමාගේ කොළොන්නාව ප්‍රශ්නය සම්බන්ධව. මෙතුමා ඉදිරිපත් කරලා තිබෙන කොළොන්නාවේ සේවිකාවගේ ප්‍රශ්නය. ඒ එක්කෙනත් හොරකම් කරපු කෙනෙක්. එතකොට මේ නිලධාරී මහත්ම මහත්මීන්ට, අපේ නිලධාරීන්ට බැණලා වැඩක් නැහැ. එතකොට ඒක නිවැරැදි කරන්න අපට පුළුවන්කමක් නැහැ. ඒක නිවැරැදි කරන්න ඕනෑ, සමූපකාර අධ්‍යක්ෂ මණ්ඩලය. ඒක සම්බන්ධව සේවක කොමිෂන් සභාවට එහෙම බලයක් නැහැ. එතකොට ඊයේත් ඒ නෝනා මහත්මිය මාව හම්බ වුණා. කොළොන්නාව සමූපකාර සමිතියේ සභාපතිවරයාට මම උපදෙස් දුන්නා. මේක නැවත සම්පූර්ණයෙන් පරීක්ෂා කරලා වාර්තාවක් මට ඉදිරිපත් කරන්න කියලා. එහෙම අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, සාධාරණයක් ඉටු කරන්න කටයුතු කරන බව. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ඇති මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට මම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටිනවා කියලා මතක් කරමින්, එහෙම සේවකයන්ගේ පෞද්ගලික ප්‍රශ්නවලට අපේ සේවක සේවිකාවන්ට මඩ ගහන්න එපාය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු ඇමැතිතුමාගේ උත්තරය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. වැරැද්දක් වෙනවා නම් ගරු ඇමැතිතුමා ඔබතුමාගේ වගකීම තමයි ඒක නිවැරැදි කරන එක. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් ඇමැතිවරයාට උත්තරයක් දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා -

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

අහගෙන හිටියේ ඇයි?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මගේ කාර්යභාරය නොවෙයි. ඒක මූලාසනයේ කාර්යභාරය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

Mr. Deputy Chairman

නැහැ. නැහැ. ගරු විපක්ෂ නායකතුමා, විරුද්ධතාවයක් නැත්නම් විෂයය භාර අමාත්‍යවරයාට ඒ සම්බන්ධව ප්‍රකාශයක් කරන්න පුළුවන්. ඒක මූලාසනයේ වගකීමක්. අපට මූලාසනය හැටියට ඔබතුමා ප්‍රශ්න -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනයේ වගකීමක් නොවෙයි. එහෙම කරන්න කරන්න බැහැ. එහෙම නම් මේ පෞද්ගලික පැහැදිලි කිරීම්වලට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් ඔබතුමා මූලාසනයට එවැනි - මම මේ සභාවේ තිබෙන රීති සංග්‍රහය තුළම කටයුතු කළොත් මම හිතනවා ඉතින් ප්‍රජාතන්ත්‍රවාදය හරියටම, අකුරටම මට ක්‍රියාත්මක කරන්නත් පුළුවන් කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කමක් නැහැ. අපි එතකොට ප්‍රජාතන්ත්‍රවාදය අකුරටම රකිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් මීට පස්සේ එහෙම කරමු නේද? අපි උත්සාහ කරන්නේ ජනතා ප්‍රශ්නවලට -

**ගරු සුනිල් ජයමිණි -** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා කියන විධියට ප්‍රශ්නයක් මතු කළාම උත්තරයක් දීලා ප්‍රශ්නය විසඳගන්න පුළුවන් නම් ඒක යහපත් ක්‍රියාවක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක ප්‍රජාතන්ත්‍රවාදය තුළ යහපත් ක්‍රියාවක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙමනම් රීති සංශෝධනය කරන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි එකඟයි. මේ රීති සංශෝධනයක් කරමු. අපිත් කැමැතියි. අදාළ ඇමැතිවරයා මෙතැන ඉඳගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා අපේ රීති කාරක සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේකම අපි යෝජනාවක් විධියට ඉදිරිපත් කරමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ලිඛිතව ඉදිරිපත් කරන්න.

පළාත් පාලන ආයතන පිළිබඳව අදහස් දැක්වීමට ඊ. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, මේ සභාවේ ඉන්න පළාත් සභා මන්ත්‍රීවරු වැඩි පිරිසක් පළාත් පාලන ආයතනවල සභාපතිවරු, උප සභාපතිවරු හා මන්ත්‍රීවරු හැටියට නියෝජනය කරලා මේ ස්ථානයට ඇවිල්ලා ඉන්නේ. පළාත් පාලන ආයතනවල නායකයින්ට විරුද්ධව සාමාන්‍යයෙන් සභාවේ, විවිධ අවස්ථාවල කථා කරලා තිබෙනවා. මීට ඉස්සෙල්ලත් දැන් විශේෂ ප්‍රකාශයක් කරපු ගරු මන්ත්‍රීතුමා කථා කෙරුවෙත්, ඒ සම්බන්ධම කාරණයක් තමයි. නමුත් අපි මේවා කියන්නේ කිසිම ද්වේෂයකින්, ක්‍රෝධයකින්, වෛරයකින් නොවෙයි. මේ පළාත් පාලන ආයතනවල තිබෙන අයථා කටයුතු ගැන කථා කරලා, මේ සභාව හරහා යම්කිසි නිවැරැදි කිරීමක් හෝ එහෙමත් නැත්නම් හරි මාර්ගයට ගැනීමක් විධියට තමයි අපි යම් යම් අවස්ථාවල අදහස් ප්‍රකාශ කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම පසුගිය අයවැය විවාදයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ පළාත් පාලන විෂය ගැන කථා කරද්දී අපට කියන්න සිද්ධ වුණා, පළාත් පාලන ආයතනවල, සමරහක් ඒවා නාමිකව. මෙන්න මේ වැරැදි කරලා තිබෙනවා කියලා. ඒක හැන්සාඩ් වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා. මම විතරක් නොවෙයි. මගේ සහෝදර මන්ත්‍රී ජානක සූරිය බණ්ඩාර මැතිතුමාත් ඒ පිළිබඳව විශේෂයෙන්ම -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මම නාමිකව නොවෙයි. පොදුවේ කථා කෙරුවේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පොදුවේ තමයි. නාමිකව නොවෙයි. පොදුවේ කථා කෙරුවත්, නාමිකව කථා කෙරුවත් පළාත් පාලන ආයතන ගැන තමයි කථා කෙරුවේ. දැන් මේ සභාවේදී මේවා පිළිබඳව කථා කිරීමේ හේතුවෙන්ම අද මට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වත්තල ප්‍රාදේශීය සභාව හරහා. මොකද මම මේ සභාවේදී කිව්වා, පළාත් සභාවට අයිති මාර්ගයක් ප්‍රාදේශීය සභාවෙන් හදලා මාස තුනකට පස්සේ පළාත් සභාවෙන් ආයෙත් කාපට් කෙරුවා කියලා. ඉතින් ඒ ගැන සොයා බලන්න කියලා තමයි කිව්වේ. නමුත් ඒ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ක්‍රියාත්මක වෙලා, ප්‍රාදේශීය සභාවට නිලධාරි කණ්ඩායමක් එවලා, ඒකත්, තවත් තිබුණු කටයුතු පිළිබඳවත් උවමනා කරන ලිපි ලේඛන අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක එතුමාගේ රාජකාරිය. ඉතින් මෙහෙම වුණාය කියලා අපට යම් යම් ස්ථානවල තර්ජන එනකොට, ප්‍රශ්න ඇති වෙනකොට - මම හිතන්නේ අපට අද බරපතළ ප්‍රශ්නයක් වී තිබෙනවා, මේ පිළිබඳව කථා කරන්න.

දැන් මම මේ ටික කියන්න විශේෂයෙන්ම හේතු වුණේත් අද මම එනකොට ගුවන් විදුලියේ ප්‍රවෘත්ති යනවා. බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්තුමිය බොහොම පැහැදිලිවම කියනවා, බස්නාහිර පළාත් සභාව ඇතුළේ තිබෙන මේ පළාත් පාලන ආයතනවලට ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභාවලට එක මාසයකට පැමිණිලි 300 ක් එනවලු. එක මාසයකට. මම මේ කියන කාරණා ගැන හිතන්න. එතකොට මේ රජයේ නිලධාරියෙක්, මේ පළාත් සභාවේ ඉන්න පළාත් පාලන කොමසාරිස්තුමිය ජනමාධ්‍යවලට කියන්නේ. එක මාසයකට පැමිණිලි 300 ක් එනවා කියලා. එතකොට අපි කියන කථාව බොරුවක් නොවෙයි කියන එක මම හිතන්නේ ඔප්පු වෙනවා. මෙතැන ඉන්න මන්ත්‍රීවරු - දේශපාලන මති මතාන්තර තිබෙන්න පුළුවන්. තමන්ගේ හෘද සාක්ෂියට කථා කරලා බැලුවොත් එහෙම මොන විධියේ අකටයුතුකම් සිද්ධ වෙනවාද? ඒ අකටයුතුකම්වලට නියමාකාරයෙන් කටයුතු කරන්න තමයි - ඒකට මේ තැන් තැන්වල තර්ජනය කරලාවත්, අපට විරුද්ධව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ආසනයට යන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක නිසා තමයි පළාත් පාලන විෂයය ගැන කථා කරද්දී මට ලැබුණු අවස්ථාවේදී මම ප්‍රකාශයක් කෙරුවේ, පොදුවේ මේ පළාත් පාලන ආයතනවල තිබෙන කටයුතු පිළිබඳව කටයුතු කරන්න කියලා. හැබැයි, ඒ කටයුතු කිරීම දීර්ඝ කාලීන යන සැලැස්මකට නොවෙයි. එහෙම යන්න ගියාම තමයි මේ ප්‍රශ්න ඇති වෙන්නේ. බොහොම ඉක්මණින් මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා හරි නම් හරි. වැරැදි නම් වැරැදි. වැරැදි නම් කොහොමද හරි මාර්ගයට ගන්නේ. මොකද, අපට කා එක්කවත් පෞද්ගලික තරහ වෙන්න, වෛරයක්, ක්‍රෝධයක් එහෙම නැහැ. එහෙම නම් ජානක සූරිය බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා නාමිකව නොකිව්වාට එතුමාත් කථා කෙරුවේ මේ පළාත් සභාව යටතේ තිබෙන -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නැහැ. නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමා කෙලින්ම කිව්වා. හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

නැහැ. නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කියපු එක නිල වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට පළාත් පාලන ආයතනවලට ගිහිල්ලා කටයුතු කරන්න බලය දෙන්න ඕනෑ, නීත්‍යානුකූලව බලය දෙන්න. ඒක තිබෙනවා. මම හැන්සාඩ් එක ගෙනැල්ලා පෙන්වන්නම්. මේ තිබෙනවා. කියවන්නද? කියපු ටික මම කියවන්නද? එතුමා කිව්වේ, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට බලය වැඩියි. ඒක නිසා ඒ බලය මේ පළාත් සභාවට පවරාගෙන පළාත් සභා මන්ත්‍රීවරුන්ට පළාත් පාලන ආයතන ඇතුළට ගිහිල්ලා වැඩ දෙන්න කරන්න කියලා. ඒක හොඳයි. තමුන්නාන්සේත් ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක්. තමුන්නාන්සේ -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ෆොන්සේකාත් නැහැ. දැන් ඉතින් මොනවා හරි කියලා, කාවහරි බිල්ලට දීලා ඡන්ද ගන්න හදනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඉන්න. සභාපතිවරුන්ගේ බලය හැල්ලු කරන්න කියලා ඉවර වෙලා,

[සභාවේ ඝෝෂා]

හැබැයි, ඒක උපයෝගී කරගෙන - දැන් මට ප්‍රශ්නයක් තිබෙනවා. මේ වාගේම තමයි මීට අවුරුදු 10 කට ඉස්සෙල්ලා මේ පළාත් සභාවේම, මේ විධියට මන්ත්‍රීවරයෙක් -

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මේක ආසනේ ප්‍රශ්නයක්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමාත් මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රාදේශීය සභාවේ ඉන්න කාලයේ, මේ සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් මේ විධියටම ප්‍රාදේශීය සභාව ගැන කථා කෙරුවා. හැබැයි, ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා. ඒක මතක තියා ගන්න. මේ පළාත් සභාවේ හිටපු සන්ධානයේ මන්ත්‍රීවරයෙකුට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා. ඒක නිසයි මම මේ කියන්නේ. මේ මන්ත්‍රීවරු ඔක්කෝම අපට එකයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මොකද මේ මාව පටලන්නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුනාන්සේ පැටලෙන්න එපා. මම පැටලුවේ නැහැ. තමුන්නාන්සේ නැඟිට්ටා. පැටලෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී මූලාසනයෙන් උපදෙස් ගන්නට පෙර ගරු විපක්ෂ නායකතුමාගෙන් මීට පස්සේ උපදෙස් ගන්න. හැබැයි, පෞද්ගලික පැහැදිලි කිරීම්වල අභිමතය තිබෙන්නේ මූලාසනයට. ඒ වාගේම විවාද සහ අනිකුත් ගැටලු සහගත තත්ත්වයන්වලට ඉඩ දෙන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම විවාදයකට පැටලුනේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා පැටලුනේ නැහැ. දැන් මෙතැන මූලාසනයටත් උපදෙස් දෙන මන්ත්‍රීතුමන්ලා ඉන්න එක ගැන කනගාටු වෙනවා. මූලාසනය හෑල්ලු කරන ප්‍රකාශවලට නම් ඉඩ ලැබෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ කියන්නේ මොන වාගේ එකක්ද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. ඔබතුමාට අහගෙන ඉන්න විතරයි කිව්වේ. දැන් ඔබතුමාගේ වෙලාව අවසන්. ඔබතුමාට තව විනාඩියක් දෙනවා. ඔබතුමාගේ ප්‍රකාශය අවසන් කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ. මේ පළාත් සභාව ඇතුළේ ඉන්න ගරු මන්ත්‍රීවරු යම් යම් ප්‍රකාශ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් කරපුවාම ඒ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කරනවා ඇරෙන්න මම හිතන්නේ විවිධ අවස්ථාවල ඒ අයට නිදහස තිබෙනවා, ඕනෑ තැනක ගිහිල්ලා කථා කරන්න. නමුත් හරි දේ මොකක්ද කියන එක පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මාර්ගයෙන් මේ පිළිබඳව විමර්ශනය කරලා, පුළුවන් තරම් ඉක්මණින් මේවා ගැන කටයුතු කරන්න. අපට ඕනෑ නැහැ කාටවත් දඬුවම් කරන්න. ඒක නිසා මම මේ වේලාවේ ඉල්ලන්නේ, කරුණාවෙන්, අපේ ආරක්ෂාවත් සලසන ගමන්ම මේ පළාත් පාලන ආයතනවල කටයුතු නියම ආකාරයෙන් කරගෙන යන්න අවශ්‍ය කරන උපදෙස් මාර්ගය නිකුත් කරන්න කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## පළාත් පාලන ආයතනවල මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම සහ අධීක්ෂණ ඒකක ඇති කිරීම
ESTABLISHING ROAD MAINTENANCE UNITS IN LOCAL GOVERNMENT INSTITUTIONS AND SETTING UP SUPERVISING UNITS

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ පසුගිය අවස්ථා තුනේම කාලවේලා ප්‍රශ්නයක් මත මේ යෝජනාව කල් ගියා. ඒ වුණත් මේ සභාවේදී මේ යෝජනාව සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මාගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මගේ යෝජනාව වන්නේ,

*"අද පළාත් පාලන ආයතන සතු මාර්ගයන්හි විශාල සංවර්ධනයක් සිදු වෙමින් පවතී. "මහ නැඟුම", "ගම නැඟුම", "පළාත් නිශ්චිත සංවර්ධන" ආදී වශයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනයක් සිදු වේ.*

*නමුත්, අද පළාත් පාලන ආයතන, මාර්ග අලුත් වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අවම මට්ටමකට පත්වී ඇත. යම් යම් මාර්ග නඩත්තු කටයුතු සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම මත එම මාර්ගයන් ඛාදනයට ලක්ව දැඩි අබලන් තත්ත්වයට පත් වී ඇති අවස්ථා අප විසින් දැක ඇත.*

*එම නිසා සෑම පළාත් පාලන ආයතනයකම මාර්ගයන්හි දෛනික නඩත්තු කටයුතු ඒකක ස්ථාපිත කර එම මාර්ග අවම මුදලක් වියදම් කර ආරක්ෂා කර ගැනීමටත් ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාවය ඇගයීම් කිරීමටත් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අධීක්ෂණ ඒකකයක් ඇති කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු යූ. ජෝර්  පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. උදෑසන තේ විවේකය සඳහා මිනිත්තු 15 කට සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.29 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 11.29 a.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එම්.එම්.එම්. අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීම සඳහා එතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[ පූ.භා. 11.29 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම බලාපොරොත්තු වෙන්නේ, මේ යෝජනාව තුළ, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව තුළ පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. මහ නගර සභා 07 ක්, නගර සභා 14 ක්, ප්‍රාදේශීය සභා 27 ක්. අපි දකිනවා. බස්නාහිර පළාත් සභාව ජනාකීර්ණ, ජන සනත්වය අධික පළාත් සභාවක් වශයෙන් මේ තුළ තිබෙන්නා වූ පළාත් පාලන ආයතනවල වගකීම පිළිබඳව කථා කිරීමේදී ඒ පළාත් පාලන ආයතනවල තිබෙන මාර්ග පද්ධතිය පිළිබඳව අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපි දැක්කා, මේ රජය තුළ පළාත් පාලන මාර්ග සංවර්ධනය කිරීම සඳහා නොයෙකුත් ක්‍රමවේදයන් හරහා මාර්ග සංවර්ධනයට ප්‍රතිපාදන ගලාගෙන ආවා. ඒක මහ නැඟුම වෙන්න පුළුවන්. ඒක ගම නැඟුම වෙන්න පුළුවන්. ඒක පළාත් සභා නිශ්චිත මුදල් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා වෙන්න පුළුවන්. මේ හරහා මම හිතන්නේ, මේ පළාත් පාලන මාර්ග විශාල සංඛ්‍යාවක් සංවර්ධනය වෙලා තිබෙනවයි කියන එක අපි මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් මතක් කරන්න කැමැතියි. ඒ වුණත් ඒවා සංවර්ධනය වන අතරතුරේදී පළාත් පාලන ආයතන සතු, ඒ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සතු වගකීමක් වෙනවා, තමන්ගේ පළාත් පාලන ආයතනවල තිබෙන ඒ මාර්ග පද්ධතිය ආරක්ෂා කිරීමේ වගකීම. අපි දැකලා තිබෙනවා. මේ ග්‍රාමීය මාර්ග, හුදකලා වුණු මාර්ග සංවර්ධනය වුණත් විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල තිබෙන ගමෙන් නගරයට එන ප්‍රධාන මාර්ග පිළිබඳව මේ අවස්ථාවේදී ඉතාමත්ම කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ. අද මේ මාර්ග සංවර්ධනය වීමේදී ගමෙන් නගරයට එන පළාත් පාලන මාර්ග සම්බන්ධයෙන් ඒ අදාළ පළාත් පාලන ආයතන ඒ සඳහා ලබා දෙන ප්‍රමුඛත්වය ඉතාමත්ම අඩු මට්ටමක තිබෙනවයි කියන එක අපි මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. අපි දකිනවා, පළාත් පාලන ආයතනවල වගකීමක් තිබෙනවා. ජනතාවගේ බදු මුදල්වලට තුලනාත්මක සංවර්ධනයක් සිද්ධ වෙන්න ඕනෑ. ජනතාවගෙන් ලබා ගන්නා බදු මුදල්වලට තුලනාත්මක සංවර්ධනයක් සිද්ධ වීමේදී ජනතා බදුවලට සරිලන සේවයක් සිද්ධ වෙන්න ඕනෑ. ඒ ජනතා බදුවලට සරිලන සේවයක් සිද්ධ වෙන්න, සෑම පළාත් පාලන ආයතනයකම තමන්ගේ මාර්ග පද්ධතියකම කාර්යක්ෂමතාවය පවත්වා ගැනීම සඳහා ඒ පළාත් පාලන ආයතනවල මාර්ග නඩත්තු ඒකක පවත්වාගෙන යන්න ඕනෑ. අද වන විට මාර්ග නඩත්තු ඒකකයන් පවත්වාගෙන යෑම - නගර සභා වෙන්න පුළුවන්. ප්‍රාදේශීය සභා වෙන්න පුළුවන්. ඒවා ඉතාමත් අඩු මට්ටමක තිබෙනවා කියන එක අපි මේ අවස්ථාවේදී ඉතාමත්ම කනගාටුවෙන් මතක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අද සෑම පළාත් පාලන ආයතනයක්ම උනන්දු වෙන්නේ නව අලුත් වැඩියාවකට නොවෙයි. නව ඉදි කිරීමකට තමයි ඒ අය යොමු වෙන්න බලාපොරොත්තු වෙන්නේ. සම්පූර්ණ ඇස්තමේන්තුවක් සකස් කරලා ඒ මාර්ගය සකස් කිරීමට විශාල මුදලක්, අඩුම ගණනේ කිලෝ මීටරයක් තාර දැමීමට රුපියල් මිලියනයක් යනවා නම් ඒ මිලියනය මම හිතන්නේ, තාර දැමීමට පෙර මාර්ගය

නඩත්තු කළා නම් රුපියල් ලක්ෂයකින්, ලක්ෂ එකහමාරකින් බේරගන්න පුළුවන් ක්‍රමවේදයන් තිබෙනවා. ඒ, දෛනික මාර්ග නඩත්තු කටයුතු කිරීමේදී. අපි දකිනවා. ඒ දෛනික මාර්ග නඩත්තු කටයුතු ඇණහිටීම තුළ වර්ෂයකට රුපියල් එක් ලක්ෂ පනස්දාහක් මාර්ග කිලෝ මීටරයට වැය වෙනවා නම්, සම්පූර්ණයෙන් ඒ පාර නොසලකා හැරීම තුළ ඒ මාර්ගය ඉදි කිරීමට රුපියල් ලක්ෂ දහයක මුදලක් වෙන් කිරීමට සිද්ධ වෙනවා. මේවා ජනතාවගේ මුදල් නාස්ති කිරීමක් කියලා අපි හිතනවා.

ඒ නිසා අපි විශේෂයෙන්ම මේවා කිරීමේදී අදාළ පළාත් පාලන ආයතනවල සභාපතිතුමාගේ අභිමතය පරිදි තමන්ගේ ක්‍රියාකාරීත්වය, තමන්ගේ ජනප්‍රියතාවය, තමන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට කර ගැනීම සඳහා ඒ න්‍යාය පත්‍රයට අනුකූලව ඒ පළාත් පාලන ආයතන කටයුතු කිරීමේදී විශේෂයෙන්ම නිර්ණායකයක් හදන්න ඕනෑ ක්‍රමවේදය අපට උදා වෙලා

[ ගරු එම්.එම්.එම් අම්ජාඩ් ]

තිබෙනවා. ඒ නිර්ණායකය හැදීමේදී අපට විශේෂයෙන්ම පළාත් සභාවට සෘජු අයිතියක් තිබෙනවා. පළාත් සභාවට සෘජු බලපෑමක් කිරීමේ අයිතිය තිබෙනවා. ඒ සඳහා අපි පළාත් සභා තුළ මේ මාර්ග නඩත්තු කටයුතු කිරීමේදී අධීක්ෂණය කිරීමට නිසි බලධාරිත්වයක් තිබෙන්නා වූ කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවය අද පැන නැඟිලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන සේවකයන් අද බස්නාහිර පළාත් සභාව තුළ අපට පළාත් පාලන ආයතනවලින් ගන්න පුළුවන්. ඒ වාගේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු සේවායතනයෙන් ඒ සේවාව අපට ගන්න පුළුවන්. අන්න එවැනි ආයතනවලින් සැදුම්ලත් කමිටුවක් හරහා මේ පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාවය ඇගයීමේ කමිටුවක් නිර්මාණය කරන්න ඕනෑය කියන එක තමයි මගේ ඉලක්කය වෙලා තිබෙන්නේ. මගේ යෝජනාවෙන් බලාපොරොත්තු වෙන්නේ ඒකයි. යෝජනාව තුළ මගේ ඉලක්කය, බලාපොරොත්තුව තිබෙන්නේ හරවත් වැඩ පිළිවෙළක්, නිසි කළමනාකාරීත්වයක්, නිසි මහ පෙන්වීමක් ඇති කර ගැනීමයි. ඒ තුළ ජනතා බදුවලට සරිලන සේවයක් කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රමවේදයක් සකස් කිරීමට අපි සැදුම්ලත් කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවය තිබෙනවා.

අපි උදාහරණයක් වශයෙන් දැක්වුවොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දකිනවා යම් යම් ප්‍රාදේශීය සභාවලට ඒ ප්‍රාදේශීය සභා මාර්ග කැණීම් කිරීමේදී, විශේෂයෙන්ම ජලනළ එළීම වැනි කටයුතුවලදී ඇස්තමේන්තු සකස් කරනවා. ඒ ඇස්තමේන්තු සකස් කරලා ඒවාට අදාළ මුදල් ඒ ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයෙන් ලබාගෙන තමයි ඒ මාර්ගය කැණීම් කරන්න අදාළ ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය දෙන්නේ. එතකොට විශාල මුදලක් ඒ මාර්ගය කැණීම් කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතනය ලබා ගන්නවා. ඒ මුදල ලබා ගත්තායින් පස්සේ ඒ මාර්ගය ඒ තත්ත්වයෙන්ම පත් කරලා, ඒ මාර්ගයට ඒ සැලකීම කරන්නේ නැතිව ඒ මුදල් අරගෙන වෙන වෙන මාර්ග සකස් කිරීමේ අවස්ථා අපි දැකලා තිබෙනවා. අන්න ඒ නිසා අපි මේ මුදල් පාවිච්චි කිරීමේදී විශේෂයෙන්ම විගණනය කිරීම සඳහා, ඒ අදාළ මුදල් අදාළ පළාත් පාලන ආයතනය අදාළ මාර්ගයටම පාවිච්චි කිරීම විගණනය කිරීමේ අධීක්ෂණ බලය මේ කමිටුවට පත් කරන්න ඕනෑය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ නිසා අද පළාත් පාලන ආයතන තමන්ගේ හුදකලා වුණු තීන්දු තීරණ ගැනීමේ අයිතිය, මේ පළාත් සභාවේ බලයට ආකර්ශණය කර ගැනීමේ අවශ්‍යතාවය අපට ඇති වෙලා තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවක් වශයෙන් කථා කිරීමේදී අපට බලය නැහැයි කියලා හුදකලා වෙන්නේ නැතිව අපට තිබෙන්නා වූ බල සීමාව තුළ අපි ඒ බලය ආරක්ෂා කරගෙන අපේ පළාත් පාලන ආයතන නිසි මහ පෙන්වීම තුළ, නිසි කළමනාකාරීත්වයක් තුළ ගමන් කිරීමට අවශ්‍ය කරන ක්‍රමවේදයන් සකස් කිරීමට අපට තිබෙන බලය පාවිච්චි කරන්න ඕනෑය කියන එක තමයි අපි මේ යෝජනාවෙන් බලාපොරොත්තු වෙන්නේ.

අද අපි දකිනවා. අපේ මාර්ග බාදනය වීම, අපේ මාර්ග අබලන් වීම ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ ඒ ඒ ප්‍රාදේශීය සභාවල මාර්ග නඩත්තු ඒකකයන් නැතිවීම නිසයි. ඒ නිසා මේ මාර්ග නඩත්තු ඒකකයන් අදාළ ප්‍රාදේශීය සභාවල වහාම ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අපි ඒ ඒ සභාවල්වලට දැනුම් දීමක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දකිනවා දෛනිකව හැම ප්‍රාදේශිය සභාවක්ම කැළි කසළ ඉවත් කරනවා. ඒක ඒ ගොල්ලන්ගේ අනිවාර්ය කාර්යයක් වෙලා තිබෙනවා. ඒ වාගේම කැළි කසළ ඉවත් කිරීම හා සමාන විධියට හැම මාර්ගයක්ම නඩත්තු කිරීම සඳහා අදාළ දෛනික ඒ නඩත්තු ඒකකය ක්‍රියාකාරීත්වයෙන් තිබිය යුතුයි කියන එක තමයි අපි දකින්නේ. ඒ නිසා අපට රුපියල් කෝටි ගණන් මුදල් වියදම් කරලා නාස්තිය දූෂණය නැති කරන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කරගන්න පුළුවන් වෙන්නේ, මේ මාර්ග නඩත්තු ඒකකයන් ඇති කිරීම තුළින්ය. කුඩා වළක් මාර්ගයේ සැදුණොත් ඒ පැච් එක කරලා සැන්ඩ් සිලින් පාරක් කරගත්තා නම්, අපට ඒ මාර්ගය අවුරුදු ගණනක් පාවිච්චි කරගන්න පුළුවන් හැකියාව තිබෙනවා. අන්න ඒකයි අපේ බලාපොරොත්තුව වෙන්න ඕනෑ. අපට රජයේ මුදල් ලැබුණත් මහ නැඟුම වැනි ක්‍රියාකාරී වැඩ කොටසක් කළත් අපට එය ප්‍රමාණවත් වෙන්නේ නැහැ, සමස්ත පළාත් පාලන ආයතනවල තිබෙන හැම මාර්ගයක්ම ආරක්ෂා කර ගැනීමට. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා ලබන අවුරුද්දේ අපේ අයවැය සකස් කිරීමේදී විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල මාර්ග නඩත්තු කිරීම සඳහා විශේෂ මුදලක් වෙන් කිරීමේ අවශ්‍යතාවය අපට මේ අවස්ථාවේදී පැන නඟිනවා. ඒ අවශ්‍ය මුදල වෙන් කරලා, ඒ කමිටුව හරහා ඒ නිර්දේශ ක්‍රියාත්මක කරලා, ඒවා අධීක්ෂණය කරලා බස්නාහිර පළාත තුළ ක්‍රමවත්, ආදර්ශමත්, ගුණාත්මක සේවාවක් පළාත් පාලන ආයතනවලින් ලබා ගැනීමට මේ යෝජනාව ඉවහල් වනු ඇතැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[ පූ.භා. 11.40 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව වර්තමානයේ ඇත්තටම කාලෝචිත වෙනවා. මොකද යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න වෙලා තිබෙන නිසයි ඇත්තටම කාලෝචිතයි කියන්නේ. මොකද අද තමන්ගේ වගකීම, තමන්ගේ යුතුකම හරියට තේරුම් අරගත්තා නම් ඇත්තටම මෙවැනි යෝජනා අපට ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ. මේ රටේ තිබෙන මහජන නියෝජිත ආයතන හතර වන්නේ අතිගරු ජනාධිපතිතුමා, පාර්ලිමේන්තුව, පළාත් සභාව සහ ප්‍රාදේශීය සභාව. ඉතින් මේ පළාත් සභාවේ විෂයයක් හැටියට ප්‍රාදේශීය සභාවේ මාර්ග හැටියට මෙවැනි යෝජනාවක් ඇත්තටම ඉදිරිපත් කරන්න වුණේ මම හිතන්නේ ඒ වගකීම, ඒ යුතුකම ඒ නියෝජිත ආයතනවලින් හරියට ඉටු නොවන නිසා. ඇත්තටම අපේ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමේදී කිව්වා වාගේ ඉතාමත්ම සුළු මුදලකින්, සුළු සේවක සංඛ්‍යාවකින් මෙය ආරක්ෂා කරගන්න පුළුවන් තත්ත්වයේ තිබෙද්දී අපි අවුරුදු ගණන් ඒ ගැන අවධානය යොමු නොකර අතිවිශාල මුදලක් වියදම් වන තත්ත්වයට අප විසින්ම පත් කර ගන්නවා. ඇත්තටම මට මතකයි. මමත් මදුරාවල ප්‍රාදේශිය සභාවේ උප සභාපති හැටියට ඉන්න කොට මම යෝජනාවක් කළා. මේ විදුලි ලාම්පුවක් ක්‍රියා නොකරන කොට ඉක්මණින් කථා කරලා ට්‍රැක්ටරයක් හෝ මොකක් හරි වාහනයක් යවනවා එය හදන්න. ඉතින් ඔය යන වාහනයේම ඔය යන පාරේ - විශේෂයෙන්ම අපට පළාත් පාලන ආයතනවලට සම්බන්ධ වැඩියෙන්ම තාර පාරවල්වල තමයි මේ ගැටලුව ලොකුවට තිබෙන්නේ. තාර දාලා නිම කරපුවා. ඉතින් ඒ නිසා මම යෝජනා කළා ඒ ලයිට් හදන්න යන වාහනයේම මේ ප්‍රිමික්ස් ටිකක් අරගෙන ගිහිල්ලා මේ අහල් දෙක තුනේ තිබෙන පොඩි වළ වැහුවා නම්, ඒ නඩත්තුව කළා නම් මම හිතන්නේ අඩි හතර පහ හය හත එක ප්‍රිමික්ස් කියුබ් තුන හතර එක වළකට වැටෙන ක්‍රමය, නඩත්තු කරන ක්‍රමය නැති වෙයි කියලා. නමුත් ඇත්තටම ඒවා ගැන ඒ ආයතන ප්‍රධානීන් හිතන්නේ නැහැ. ඒ නිසා තමයි ඇත්තටම මෙවැනි යෝජනා අපට ගෙනෙන්න වෙලා තිබෙන්නේ. නමුත් ඇත්තටම ඒවා ගැන ඒ ආයතන ප්‍රධානීන් හිතන්නේ නැහැ. ඒ නිසා තමයි ඇත්තටම මෙවැනි යෝජනා ගේන්න අපට වෙලා තිබෙන්නේ. ඉතිහාසයේ අපි දැක්කා. අතිගරු ජනාධිපතිතුමා 2005 දී පත් වෙන්න ඉස්සෙල්ලා පාරවල් කොයි ආකාරයෙන්ද නඩත්තු වුණේ කියලා.

ඒ කාලේ මෝටර් ග්‍රේඩරයක් ගමකට ආවාම, ඒ ගමම ඒ වෙනුවෙන් කරන්න පුළුවන් උදව්ව කරනවා. ඒ වැලි පාර හොඳට වතුර දෙපැත්තට බැස යන ආකාරයට සකස් කරනවා. ඒක තමයි කර ගන්න ඕනෑකම තිබුණු ලොකුම දේ. කොන්ක්‍රීට්වත්, තාරවත්, කාපට්වත් නොවෙයි. මේ මෝටර් ග්‍රේඩරයක් ගෙනැල්ලා දෙපැත්තට හැඩ වෙන්න වතුර බැහැලා යන වැඩ පිළිවෙළ තමයි ඒ කාලේ බලාපොරොත්තු වුණේ. ඉතින් එහෙම වැලි පාර ඒ තරම් ආරක්ෂා කර ගන්න හිතපු අපි, අද ඇත්තටම ඊට එහා ප්‍රතිලාභ ලැබිලා, තාර ලැබිලා, එහෙම නැත්නම් පාරවල් කාපට් කරලා තියෙනවා. එහෙම නැත්නම් කුට්ටි ගල් අතුරලා ඒ මාර්ග සාදා දෙනකොට ඒ ඉතිරි වැඩ ටික ජනතාව වාගේම ප්‍රාදේශීය සභාවේ වගකියන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවන නිසා ඇත්තටම මෙවැනි යෝජනා අද අපට ගේන්න වෙලා තිබෙනවා. ඒ නිසා ඒ තුළින් මම දකින්නේ ජනතාවත් තමන්ගේ වගකීම අවබෝධ කරගෙන නැහැ. අපි දැන් අලුත් පාරක් හදලා දුන්නාම. උදාහරණයක් වශයෙන් කොන්ක්‍රීට් - මග නැගුම වේවා, දිවි නැගුම වේවා. එහෙම නැත්නම්, ගමකට එක වැඩක්. ඒ අකාරයට මොන වැඩ පිළිවෙළකින් හරි මේ රටේ තිබෙන මහජන නියෝජිත ආයතන මොකකින් හෝ මධ්‍යම රජය වෙන්න පුළුවන්. පළාත් සභාව වෙන්න පුළුවන්. ඒ ලබා දුන්නාම ඒකේ අවසානයේ තමන්ගේ කියන හැඟීම ජනතාවටත් නැහැ. ඒ වාගේම ප්‍රාදේශීය සභාවටත් නැහැ. මේ අපේ පාරකටයි මේ ප්‍රතිපාදන ලබා දුන්නේ කියන හැඟීම නැතිකම තමයි තියෙන්නේ. අපි දකිනවා. ප්‍රාදේශීය සභාවට අයිති පාරවල්වල කොන්ක්‍රීට් දැම්මාම, සමහර වෙලාවට අඩි 12, 13, 15 පළල තිබෙන පාරවල් තිබෙනවා. ඒවාට අඩි 8 ක් හෝ 10 ක් වාගේ කොන්ක්‍රීට් දැම්මාම ඉස්සෙල්ලා වැලි පාරේ වාහන දෙකක් මාරු වෙන්න පුළුවන්. මේ කොන්ක්‍රීට් දැම්මාට පස්සේ මාරු වෙන්න බැහැ. මර්ගය දෙපැත්තේ නිවෙස් හිමියෝවත්, ප්‍රාදේශීය සභාවෙන්වත් ඒවා නිවැරදි විධියට ගොඩ කරලා, තණකොළ පිඩැල්ලක් ඇල්ලුවා නම් ඒ පාර සමාන්තර වෙනවා. එහෙම නොවන නිසා සමහර පාරවල් ඇත්තටම වාහන යන කොට ලොකු අපහසුතාවයන්වලට පත් වෙලා තිබෙනවා. මේක ජනතාවගේ පැත්තෙනුත් ඇත්තටම වග කිව යුතු වැඩ පිළිවෙළක් වාගේම ප්‍රාදේශීය සභාවෙත් වග කිවයුතු වැඩ පිළිවෙළක්. ඒ නිසා ඒ ලබා දෙන ප්‍රතිපාදනවලින්, සම්පූර්ණයෙන්ම පාර හදන්න බැරි වෙන්න පුළුවන්. නමුත් ඒ ලබා දෙන ටික හෝ හරියට රැක ගත්තොත් අපට හැමදාමත් අලුත් විධියට වැඩි මුදල් ප්‍රතිපාදනයක් වෙන් කරන වැඩ පිළිවෙළින් බැහැර වෙලා, ඒ තිබෙන දේ හරියට නඩත්තු කර ගත්තොත් මේ රටේ අපතේ යන මුදල් ඇත්තටම මීට වඩා වෙනත් කාර්යයන්වලට යොදවා ගන්න පුළුවන් වෙනවා. අද අපි දකිනවා. විශේෂයෙන්ම මේ මෑත භාගයේ ඉඳලා අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ සටහනක් අනුව මේ කුට්ටි ගල් අතුරන වැඩ පිළිවෙළක් යනවා. ඉතාමත්ම සාර්ථක වැඩ පිළිවෙළක්. සමහර ස්ථාන කාර්මික නිලධාරීන් බලලා, අවශ්‍ය ආකාරයට ඒ ඇස්තමේන්තු හදනවා. සමහර තැන්වලට නොගැලපෙන්න පුළුවන්. ඉඳලා හිටලා. ඒ තැන්වලට ඒ අවශ්‍යතාවය වෙනුවෙන් වැඩ පිළිවෙළවල් තිබෙනවා වාගේම මෙය ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක්. යම්කිසි ස්ථානයක පොඩි ඩැමේජ් එකක් ආවා නම් ඇත්තටම ඒක අයින් කරලා නැවතත් යථා තත්ත්වයට හදන්න පුළුවන් වැඩ පිළිවෙළක්.

නමුත් අපට කනගාටුවට කාරණයක් තිබෙන්නේ, මේවා කරන කොන්ත්‍රාත්කරුවන් සමහර අය ඇත්තටම පස්ස ගහනවා. ඇත්තටම කොන්ක්‍රීට්වලට වඩා මේකේ ලාභය මදියි කියන වැඩ පිළිවෙළද දන්නේ නැහැ. ඒ නිසා ඒ හොඳ දේත් අපට හරියට ලබා දෙන්නත් සමහර වෙලාවට අපහසු වෙලා තිබෙනවා. ඒ නිසා අපේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් ගැඹුරින් හිතලා, අපේ නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් අපේ ප්‍රධාන අමාත්‍යතුමාට ඇත්තටම යොමු කළ යුතුයි, මේ වැඩ පිළිවෙළ තුළ. නැත්නම් අපි හෝද හෝදා මඩේ දැම්මා වාගේ වැඩ පිළිවෙළක් තමයි අපට එන්නේ. ඒ නිසා අපි හරි දේ කරන වැඩ පිළිවෙළට මේ කාර්යය අනුව, මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවට අනුව කටයුතු කරලා, අපේ ප්‍රාදේශීය සභාවට අයිති මාර්ග අපි හොඳ තත්ත්වයක පවත්වාගෙන යන්න වැඩ පිළිවෙළක් සකස් කරමුයි කියලා ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.46 ]

**ගරු යූ. ජෝර් පෙරේරා** – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ කාලෝචිත යෝජනාව සම්බන්ධව අපගේ ස්තුතිය ප්‍රකාශ කරනවා වාගේම අපට ස්ථිර කරන්නත් අවස්ථා ලැබුණා. ඇත්තටම එතුමා එම යෝජනාවේ සඳහන් කරන්නේ පළාත් පාලන ආයතන සම්බන්ධවත්, දෛනික නඩත්තු කටයුතු මෙන්ම කාර්යක්ෂම සේවයක් ඇති කිරීම සඳහාත් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය මගින් අධීක්ෂණ සේවාවක් ඇති කරන්නය කියලයි. ඇත්තටම මහා මාර්ග පළාත් සභාව තුළත් තිබෙනවා. එතුමාත් සහභාගී වුණා. සාර්ථක කොරියන් සංචාරයක් නිම කරලා ඊයේ තමයි අපි ආවේ. අපි මහා මාර්ග සම්බන්ධ අමාත්‍යාංශයෙන් ගියේ. එහි මහා මාර්ග සම්බන්ධව සාර්ථකව අධීක්ෂණය කරලා අද දවසේ එතුමා මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව සතුටු වෙනවා. සාර්ථකව මහා මාර්ග අධීක්ෂණයක් කොරියාවේදී කළා. එවැනි අවස්ථාවක අම්ජාඩ් මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ඒම තුළ විපක්ෂය විසින් කළ යුතු දෙයකුත් සඳහන් කරලා තිබෙනවා. ඇත්තටම මේ තුළ එතුමාගේ රජයේ එතුමාගේම පළාත් පාලන ක්ෂේත්‍රයේ තිබෙන පසු වැටහීම තමයි මීත් පෙනිලා තිබෙන්නේ කියලා අපි නම් දකින්නේ. ඒ කියන්නේ, පළාත් පාලන අංශයේ කාර්යක්ෂමතාවය – ප්‍රාදේශීය සභාවල, නගර සභාවල, මහ නගර සභාවල සභපතිවරයෙක්, නගරාධිපතිවරයෙක් ඉන්නවා. ඒවා අධීක්ෂණය කරන්න පළාත් පාලන කොමසාරිස් ඉන්නවා. පළාත් සභාවේ අදාළ අමාත්‍යවරයෙක් ඉන්නවා. ඒ වාගේ තිබෙනවා. මේ සියලුම දේ තුළ අද එතුමාට අකාර්යක්ෂමතාවය තමයි පෙනිලා තිබෙන්නේ. කෙසේ වෙතත් මෙම යෝජනාව සම්බන්ධව අපි සතුටු වෙනවා. ඇත්තටම මග නැගුම, ගම නැගුම යටතේ ව්‍යාපෘති කෙළින්ම සිදුවෙන්නේ ප්‍රාදේශීය සභා තුළින්. හැබැයි, මුදල් එන්නේ ආර්ථික කටයුතු අමාත්‍යාංශය නැත්නම් වෙනත් අමාත්‍යාංශවලින්. ඒත් කෙරෙන්නේ ප්‍රාදේශීය සභාවෙන්. එතකොට ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණයෙන් තමයි ඒ පාරවල් කෙරෙන්නේ. මුදල් වෙන තැනකින්. කරන්නේ ඒ සභාපතිවරුන්ගේ, නැත්නම් ඒ මන්ත්‍රීවරුන්ගේ හෙංචයියෝ. කොන්ත්‍රාත්කරුවෝ. එහෙම කරන කොට නියමිත ප්‍රමිතියක් නැහැ. මේක තමයි ඇත්ත දේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක තමයි අද පළාත් පාලන ක්ෂේත්‍රයේ වෙලා තිබෙන්නේ. මේ පසු බැසීම නිසා තමයි නඩත්තු ඒකකයක් අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒත් පළාත් සභා ගත්තොත්, පළාත් නිශ්චිත අරමුදල්වලින් කෙරෙන – මේ බස්නාහිර පළාත් සභාවේ මහා මාර්ග අමාත්‍යතුමා. මහා මාර්ග අධිකාරිය. අපි දකිනවා, බස්නාහිර පළාතේ වැඩ කරන කොට යම්කිසි ප්‍රමිතියකින් – මම පුද්ගලිකව දැක්කා. මහා මාර්ග අධිකාරියෙන් වෙනම වාහන ඇවිල්ලා, අධීක්ෂණය කරලා සම්පූර්ණ වාර්තාවක් ඒ අමාත්‍යාංශයට යනවා. මේ ප්‍රාදේශීය සභාවල එහෙම දේවල් වෙන්නේ නැහැ. මේවා අත යටින් යන සල්ලිවලින් සිදුවෙන වැඩ පිළිවෙළක්. 10% ක් ඒ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු තමයි මේ කොන්ත්‍රාත් ගන්නේ. මෙවැනි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙන්නේ. පළාත් මාර්ග නිශ්චිත අරමුදලුත් මේ යෝජනාවටම ඇතුළත් කළාට, මේක ඇතුළත් වෙන්නේ අපේ මහා මාර්ග අමාත්‍යාංශයට. කෙසේ වෙතත් අද පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණ ඒකකයක් මෙන්ම මම යෝජනා කරනවා, ඒ පළාත් පාලන ආයතනය අපට භාරව ඉන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. අපේ ප්‍රධාන අමාත්‍යතුමා බස්නාහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතනවලට, ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභාවලට ඩබල් කැබ් දුන්නා. ට්‍රැක්ටර් රථ දුන්නා. අපි සතුටු වෙනවා. ඒවා වෙන්න ඕනෑ. කාර්යක්ෂමතාවය වැඩි කරන්න. ඒ දෙනවා වාගේම මෙතුමා මේ යෝජනා කරපු මේ නඩත්තු ඒකකයට යම්කිසි වාර්ෂික මුදලක් මිලියන කීයක් හරි හැම ප්‍රාදේශීය සභාවකටම දෙන්න කියලා ඉල්ලීමක්, යෝජනාවක් වශයෙන් මම ගේනවා.

ඒ වාගේම අද ප්‍රාදේශීය සභාවලින් එකතු කරන බදු මුදල්වලින් මොනවාද කරන්නේ කියන එක විපක්ෂය වශයෙන් අපි ප්‍රශ්න කරනවා. අද ඔක්කොම පාරවල්වලට සල්ලි ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙනවා. බස්නාහිර පළාතෙන් එනවා. වෙනත් අමාත්‍යාංශවලින් එනවා නම් මේ බදු මුදල්වලින් මොනවාද කරන්නේ? මේ ගැන විශේෂ විගණනයක් කරන්නත් කියලා මේ යෝජනාව තුළින් අපි යෝජනා කරනවා. ඒක කළ යුතුයි කියන එක තමයි අපි ඇත්තටම ඉල්ලීමක් කරන්නේ. අපි දකිනවා. අපේ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා අද දවසේ පළාත් පාලන ක්ෂේත්‍රයේ මේ සම්බන්ධයෙන්ම තමයි විශේෂ ප්‍රකාශය කළේ. මේ තුළම එතුමා කිව්වා, බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය ගුවන් විදුලි වැඩසටහනක සඳහන් කළා කියලා මාසෙකට පැමිණිලි 300 ක් පමණ එනවා කියලා. තුන්සියයෙන් දෙසිය පනහකට වඩා

එන්නේ මේ පැමිණිලි තමයි. මේ පළාත් පාලන ක්ෂේත්‍රයේ මහා මාර්ගවල තියෙන අඩු පාඩු, කරපු වැඩවල ප්‍රමිතියක් නැති, නැත්නම් කොන්ත්‍රාත්වල, නැත්නම් සභාපතිතුමාගේ ක්‍රියාදාමය ගැන පැමිණිලි. ඇත්තටම මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්නය කියලා අවංක ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තව යෝජනාවක් කරනවා. මමත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වෙලා මේ තත්ත්වයට ආපු මන්ත්‍රීවරයෙක් වශයෙන්. ප්‍රාදේශීය සභාවල විශාල පාරවල් තියෙනවා. කිලෝ මීටර තුන හතර පාරවල්. ප්‍රාදේශීය සභාවට නඩත්තු කරන්න බැහැ. එම නිසා බස්නාහිර පළාතේ මහා මාර්ග අධිකාරියට පවරා ගෙන ඒ බර අපි අර ගෙන, ඒ නඩත්තුවත් අපි ගත්තොත් මෙවැනි දේවල් වෙන්නේ නැහැ. ප්‍රාදේශීය සභාවට ඒ බර අඩු වෙනවා. ප්‍රාදේශීය සභාවට එය දරන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. එම නිසා මෙම යෝජනාව තුළින් මම යෝජනා කළ ඒ අංශ තුනම, එකක් වාර්ෂික මුදලක් ලබා දෙන්න. ඒ වාගේම විගණන ඒකකයක් ඇති කරන්න. අපේ බදු මුදල්වලට වෙන්නේ මොනවාද? ඒ වාගේම කිලෝ මීටර තුන, හතර තියෙන පාරවල් අපේ පළාත් සභාවට පවරා ගෙන ඒ වැයත් අඩු කර ගෙන මේ යෝජනාව තුළින් ශක්තිමත් වෙමුයි කියලා ඉල්ලීමක් කරමින් මම නිහඩ වෙනවා. ස්තුතියි.

[ පූ.භා. 11.51 ]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සමස්ත පළාත් පාලන ආයතනවල වගකීම නැවත වතාවක් අලුත් මුහුණුවරකට ගේන්න හොඳ යෝජනාවක් වශයෙනුයි මම මෙය දකින්නේ. පළාත් පාලන ආයතනයක දිර්ඝ කාලයක් සභාපති ධූරයේ කටයුතු කරලා තියෙනවා. එදා පළාත් පාලන ආයතනයකට විශාල වගකීමක් සතු වෙලා තිබුණා, තමන්ගේ බල ප්‍රදේශයේ තිබෙන මාර්ග පිළිබඳව. නැත්නම් පළාත් පාලන ආයතන සතු මාර්ග පද්ධතිය පිළිබඳව. එහි නඩත්තු කිරීම්, ඒවා සකස් කිරීම් වැනි විශාල කාර්ය භාරයක් පළාත් පාලන ආයතනයේ තිබුණු වැදගත්ම විශේෂාංගයක් වුණා. විශේෂයෙන් මාර්ග පද්ධතිය සකස් කිරීම. එදා ගම් සභා කාලයේ ඉඳන්ම කළෙත් ඒකයි. ගම් සභාපතිවරු පත් වෙලා, තමන්ගේ ගමේ තියෙන මාර්ග පද්ධතිය ශ්‍රමදාන පදනම මත, එහෙම නැත්නම් වෙනත් වෙනත් උපක්‍රම මත, වෙනත් සංවිධානාත්මකව, ගම් සභාව මගින් පළාත් පාලන ආයතනය සතු පාරවල් නඩත්තු කර ගෙන ගියා. ඒ එක පැත්තක්. ඒ ආකාරයෙන් යන කොට මෑත කාලයේදී මේ රටේ මහා මාර්ග පද්ධතිය තුළ විශාල සංවර්ධනයක් සිදු වුණු බව අපි දන්නවා. ඊට පස්සේ පළාත් සභා මාර්ග පද්ධතියත් ඒ වාගේ සංවර්ධන ක්‍රියාදාමයකට ගමන් කළා. බස්නාහිර පළාතේ පළාත් සභා මාර්ග කිලෝ මීටර් 1900 කට ආසන්න සංඛ්‍යාවක් තියෙනවා. ඒ මාර්ග කිලෝ මීටර් ගණන මේ වන විට වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමාගේ, නායකත්වය, මූලිකත්වය මත වර්තමාන පළාත් මාර්ග ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාර්ග කිලෝ මීටර විශාල ගණනක වැඩ අවසන් කරලා තියෙනවා. ඒ වැඩ අවසන් කිරීමත් එක්කම අපට ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් විශාල හයියක්, ශක්තියක් ලබා දුන්නා. ඒ වැඩ සටහනත් එක්ක අපි මාර්ග සංවර්ධනය අරගෙන ගියා. අපි පළාත් සභා මාර්ග පද්ධතියේ වැඩ ඒ ආකාරයනේ කර ගෙන යන කොට මේවා නඩත්තු කිරීම් සඳහා විශාල කාර්ය මණ්ඩලයක් ඉන්නවා. විශාල ඉංජිනේරු මණ්ඩලයක්. කාර්මික නිලධාරි මණ්ඩලයක්. විශාල කොන්ත්‍රාත් ලියාපදිංචි කණ්ඩායමක්. මේ මාර්ග කිලෝ මීටර් එක්දහස් නවසිය ගණන නඩත්තු කරන්න විශාල වැඩ සටහනක් තියෙනවා. ඒ ආකාරයෙන් පවත්වා ගෙන යන්න. මම විශ්වාස කරනවා, පළාත් සභාවේ මාර්ග කිලෝ මීටර් ගණනට වඩා වැඩි ගණනක් පළාත් පාලන ආයතන සතු වෙලා තියෙනවා. ග්‍රාමීය මට්ටමේ ජනතාවට, එදිනෙදා ජීවිතවලට, ඉතාම සමීප මාර්ග පද්ධතියක් පළාත් පාලන ආයතන සතු වෙලා තියෙන්නේ. මේ පළාත් පාලන ආයතන සතු මාර්ග පද්ධතිය එදා අපි පළාත් පාලන ආයතනවල ඉන්න කාලයේ වාගේ වගකීමකින් ඒ නඩත්තු කිරීමේ කාර්ය කරන්නේ නැහැයි කියන චෝදනාවත් එක්ක තමයි මේ අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව මේ සභාවට අද ගෙනාවේ. ඒ නිසා මේ පිළිබඳව වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියන තැන ඉඳගෙන තමයි මම හිතන්නේ, මේ සියලු දෙනා අදහස් දක්වන්නේ.

ඒ වාගේම තම තමන්ගේ පළාත් පාලන ආයතනය සතු මාර්ග කිලෝ මීටර ගණන කීයද කියලා ඇහුවොත් පළාත් පාලන ආයතනය දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි පළාත් සභාවෙන් වැඩ පිළිවෙළක් සකස් කරලා, නියමිත පරිදි පළාත් පාලන ආයතනය සම්බන්ධ කරන්න වෙනවා. අපි යෝජනා කරනවා. තම තමන්ගේ පළාත් පාලන ආයතනය සතු මාර්ග කිලෝ මීටර් ගණන A ශ්‍රේණිය, B ශ්‍රේණිය කියලා වර්ගීකරණය කරලා, ඒ නාම ලේඛනයක් සභාගත කරලා, ඒ කිලෝ මීටර් ගණන එක එක් මට්ටමින් නඩත්තු කරන්නේ කොහොමද කියන එක පිළිබඳව, ඒ පළාත් පාලන ආයතනයේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් යම් මුදල් ප්‍රමාණයක් වැය කරලා, ඒ සඳහා කාර්ය මණ්ඩලයක් ඒ ඒ පළාත් පාලන ආයතනය සතු කර දීම, වැඩ පිළිවෙළක් සකස් කර දීම පළාත් සභාවේ අප සතු වගකීමක් වශයෙනුයි මම දකින්නේ. ඒ විතරක් නොවෙයි. අපේ පළාත් පාලන ආයතනවලට විශාල මුදල් සම්භාරයක් ඒ මාර්ග පද්ධතිය සකස් කරන්න අපි වැය කරනවා. ඒ විතරක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමා මේ රටේ නායකත්වය ගත්තාට පසුව 2005 අවුරුද්දේ ඉඳන් මේ දක්වා අලුත් වැඩ පිළිවෙළක් ගෙනාවා. ගම නැගුම, මග නැගුම කියන වැඩ සටහනත් එක්ක. ඒ වාගේ වැඩ සටහන් ඊට කලින් තිබුණේ නැහැ. ඒ නිසා ඒ වැඩසටහන්වලින් අද පළාත් පාලන ආයතනය සතු වගකීම ලෙස ගම නැගුමයි, මග නැගුමයි කියන ඒ ව්‍යාපෘති දෙක භාර ගත්තා. ඒ භාර ගැනීමත් එක්ක තමයි පළාත් පාලන ආයතනයෙන් ගිලිහී යන්න පටන් ගත්තේ. ඒ වගකීම අත්හැරලා

ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට, ගම නැගුමට, මග නැගුමට භාරදීලා පළාත් පාලන ආයතනය සතු ඒ විශාල මුදල් සම්භාරය වෙනත් දේවලට වැය කරන්න පළාත් පාලන ආයතන සූදානම් වුණේ, ඒ වගකීම ගත්තු නිසා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මම පෙන්වා දෙනවා. මේ අවස්ථාවේදී එහෙම කරන්නේ නැතුව අපි පළාත් සභාවේ යම් මුදලක් පළාත් පාලන ආයතනයට ලබා දෙනවා නම්, ඒක මාර්ග සකස් කිරීම සඳහා නොදී මාර්ග සකස් කිරීම වෙනුවට - අපි මාලු ඉල්ලා ගෙන එන මිනිහෙකුට අද මාලු කිලෝ එකක් අරන් දුන්නොත් පහුවෙනිදාත් එනවා අනේ මට මාලු කිලෝ එකක් අරන් දෙන්න කියලා කියන්න. ඒ නිසා මාලු දෙනවා වෙනුවට අපි ඇළක් පෙන්නලා බිලී පිත්තක් දුන්නා නම් අහවල් තැනින් මාලු බා ගන්න කියලා. එයාට හැමදාම පුළුවන්කමක් තියෙනවා මාලු අල්ලා ගෙන කන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේ පළාත් පාලන ආයතනවලට සල්ලි දෙනවා වෙනුවට මම යෝජනා කරනවා, ඒ පළාත් පාලන ආයතනයෙන් සකස් කරන වැඩ ඒකක - අපේ වකවානුවේ තිබුණා, ස්ථිරවම තාර සකස් කිරීමේ වැඩ ඒකකයක්.

[ ගරු යසපාල කෝරළගේ ]

පාරවල් එළිපෙහෙළි කර නඩත්තු කිරීමේ ඒකකයක් තිබුණා. අන්න ඒ වාගේ වැඩ ඒකක සකස් කරන්න අවශ්‍ය කරන ආම්පන්න ටික අපට අරන් දෙන්න පුළුවන් නම්, ඒ වාගේම අපි ඒ ආම්පන්න ටික අරන් දීලා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒවාට අවශ්‍ය කරන නිලධාරි මණ්ඩලය, එහෙම නැත්නම් සේවක පිරිස ඉන්නවාද කියලා බලන්න පුළුවන් නම්, අපි පළාත් සභාවෙන් පළාත් පාලන ආයතනයට වැය කරන මුදල ඉතාමත් ප්‍රයෝජනවත් වෙනවා කියන යෝජනාව සහ මගපෙන්වීම පෙන්වා දෙමින් අම්ජාඩ් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉතාමත්ම කාලෝචිත කියලා ප්‍රකාශ කරමින් ඒ සඳහා මට අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම බොහොමත් ස්තුතියි.

[ අ.භා. 12.01 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව අද සාකච්ඡා කරන වෙලාවේ මට මතකයට එන්නේ 2007 අවුරුද්දේ මේ සභාව නියෝජනය කරපු ජනතා විමුක්ති පෙරමුණේ අනුර හේමපාල ගරු මන්ත්‍රීතුමාවයි. එතුමා මේ විදියටම, මේ අර්ථය තිබෙන යෝජනාවක් මේ පළාත් සභාවට ඉදිරිපත් කළා. මමත් එදා ඒ යෝජනාව පිළිබඳ සාකච්ඡාවට සහභාගී වුණා. නමුත් දැන් අවුරුදු හයක් ගත වෙලා අවසානයි. ඒ යෝජනාව ක්‍රියාත්මක නොවුණු තැන තමයි නැවත වතාවක් ආණ්ඩු පක්ෂයේ අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා වචන ටිකක් විතරක් එහාට මෙහාට කරලා ඒ යෝජනාව නැවත වතාවක් මේ සභාවට ඉදිරිපත් කරන්නේ. මේ සභාවේ දැන් යෝජනාව සාකච්ඡා කරන වෙලාවේ විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු මේ පිළිබඳව ඉතාමත් හොඳ විවරණයක යෙදුණා. එහෙම යෙදෙන්නේ පළාත් පාලන ආයතනවල තිබෙන අකාර්යක්ෂමතාවය නිසාමයි. විශේෂයෙන්ම පොදුවේ අද පාරවල් පිළිබඳව මේ මන්ත්‍රීවරුන්ට දෝෂාරෝපණ එල්ල වෙන්නේ පාර්ලිමේන්තුවේ වේවා, පළාත් සභාවේ වේවා පළාත් පාලන ආයතනවලට අයිති වන මාර්ගවල තිබෙන තත්ත්වය නිසාමයි. ඒකේ මූලික හේතුව තිබෙන්නේ, මේ මාර්ග නිසි ප්‍රමිතියකට ඉදි කිරීමට හැකියාවක් තිබුණත්, ඒ පිළිබඳව ඇස්තමේන්තු සකස් කළත්, කොන්ත්‍රාත් එක භාර දුන්නත් නිසි ප්‍රමිතියට ඉදි නොකිරීම නිසයි. ඒක තනිකරම පළාත් පාලන ආයතනයේ තිබෙන නායකත්වයට - මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි. ඉන්න කාර්මික නිලධාරීන්ටත් විශේෂයෙන්ම එහි වගකීම පැවරෙනවා. පළාත් පාලන ආයතන අධීක්ෂණය කිරීමේ සෘජු බලයක් පළාත් සභාවට තිබෙනවා. ඒ බලය තමයි මේ අපි උපයෝගී කර ගන්න හදන්නේ. එහෙම උපයෝගී කර ගන්න කොට අපි යම් යම් මිනුම් දඬුවල සීමාවල හිර වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් මම මේ යෝජනාව හරහා කියන්න කැමැතියි. යම්කිසි මාර්ගයක් පළාත් පාලන ආයතනයකින් සකස් කරනවා නම්, ඒ මිනුම් දඬු සකස් කිරීමේදී නිසි හඳුනා ගැනීම, ඊළඟට ප්‍රමුඛතාවය දෙන්න ඕනෑ කොයි මාර්ගයටද? ඒ ගුණාත්මක භාවය සහ විශේෂයෙන්ම පසුවිපරම කියන එක ඉතා වැදගත්. මොකද, මාස තුන හතරක් යන කොට මේ පළාත් පාලන ආයතනවලින් ඉදි කරන මාර්ග නැවත වතාවක් සකස් කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒක මම හිතන්නේ අපි මොන තරම් විධියට අධීක්ෂණය කළත් මේ වන කොට ඉතාම අසාර්ථක තත්ත්වයක තමයි පළාත් පාලන ආයතනවල මාර්ග තිබෙන්නේ. ඒ පිළිබඳව මම හිතන්නේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාට මතකය අවදි කරනවා නම්, හරියටම මීට මාස 15 කට ඉස්සෙල්ලා එතුමා ආවා අපේ ගෙදර. ලාන්සා අපේ ගරු ඇමතිතුමාත් එක්ක. තවමත් ඒ පාර ඒ විධියම තමයි. හැබැයි මෙතැන සාකච්ඡා වුණා පළාත් පාලන ආයතනයක මාර්ග, විශේෂයෙන්ම යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමා. පාරවල් කැණීමේදී ඒ පළාත් පාලන ආයතනයට ජල සම්පත් මණ්ඩලයෙන් කළත්, එහෙම නැත්නම් වෙනත් ආයතනයකින් කළත්, ටෙලිකොම් එකෙන් කළත් ඒ මුදල් ඉස්සෙල්ලා බැඳලා තමයි ඒ වැඩේ පටන් ගන්න ඕනෑ කියලා. මම ඉන්න පාරත් එහෙම්මම තමයි. ජල සම්පත් මණ්ඩලයට ලක්ෂ ගණනක මුදලක් බැඳලා තමයි 2011 වර්ෂයේ පාර කැණීම කරලා ඒ ජල නල එලුවේ. නමුත් අද වන තෙක් තවම බැරිව ගියා ජා-ඇළ ප්‍රාදේශීය සභාව හරහා ඒ වෙන් කරපු මුදල යොදවා ගෙන පාරේ අඩු ගණනේ කඩතොලුටිකවත් වහලා දාන්න. දැන් අපට සිද්ධ වුණා අන්තිමට විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා, ගරු ලාන්සා ඇමතිතුමාගේ මාර්ගයෙන් මේ පළාත් සභාවේ මුදල්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මුදල් යොදවලා මේ ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ මේ මාර්ගය කාපට් කරන්න. දැන් ඒ කටයුතු කර ගෙන යනවා. මේක තමයි ඇත්ත කතාව. මේකට මම හිතන්නේ කවුරුවත් උරණ වෙන්න වුවමනාවක් නැහැ.

හැබැයි දැන් වෙලා තිබෙන්නේ මේ පිළිබඳව පසුවිපරමක් නොකරපුවාම, අධීක්ෂණයක් නොකරපුවාම, සොයලා නොබැලුවාම මේ පළාත් සභාවට තිබෙන බලතල උපයෝගී කර ගෙන අර සභාපතිවරු ඔහේ පිස්සු නටනවා. තම තමන්ගේ පෞද්ගලික මති මතාන්තර ඉෂ්ට කර ගන්න. නිසි ක්‍රමවේදයක් නැතිකමේ තිබෙන එල විපාක තමයි අපි මේ විඳින්නේ. මේ යෝජනාව හරහා කියන්නේ මොකක්ද? එක එක ව්‍යාපෘති සම්බන්ධව මෙහි ආණ්ඩුවේ සල්ලි විශාල වශයෙන් තිබෙනවා. ඒවා ගැන නොවෙයි. පළාත් පාලන ආයතන සතු මාර්ග සකස් කිරීමේදී මේ පළාත් සභාවට ඒ බලය ලැබෙන විධියට අධිකාරියක්, එහෙමත් නැත්නම් අධීක්ෂණය කිරීමේ ඒකකයක් පිහිටුවන්නය කියලයි. ඒක මම හිතන්නේ, ඉතාම හොඳ වැඩක්. මම ඒක තමයි කිව්වේ. මීට අවුරුදු හයකට ඉස්සෙල්ලාත් මේ යෝජනාව ඉදිරිපත් වුණා. නමුත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මේ වෙලාවේ මේක ඉදිරිපත් කරන අවස්ථාවේදී අපට වගකීමක් තිබෙනවා පළාත් සභාව හැටියට - බැණුම් අහන්න ගියාම මේක පළාත් සභාවද? පාර්ලිමේන්තුවද? ප්‍රාදේශීය සභාවද? නගර සභාවද? කියලා නැහැ. ජනතාව දන්නේ නැහැ. බදු ගෙවන ජනතාව. පොදුවේ තමයි කාටත් බණින්නේ. ඒ නිසා පළාත් සභාවක් හැටියට අපේ වගකීම තිබෙනවා. මෙය යෝජනාවකට විතරක් සීමා කරන්නේ නැතිව වැඩි මුදලක් මේකට වෙන් කරන්න වුවමනාවක් නැහැ. විශාල කාර්ය මණ්ඩලයක් යොදවන්න වුවමනා වෙන්නේ නැහැ. එහෙම නැත්නම් කාර්යාල නඩත්තු කිරීමක් ඕනෑ වෙන්නේ නැහැ. මේ කරන කාර්යය පිළිබඳව දැනීමක් තිබෙන, අවශ්‍යතාවය තිබෙන, වුවමනාවක් තිබෙන පිරිසක් විතරයි මෙයට වුවමනා වෙන්නේ. ඒ සඳහා මම හිතන්නේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ දායකත්වය ලබා ගන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි අපේ එක මන්ත්‍රීවරයෙක් කිව්වේ. පළාත් පාලන ආයතනවල තිබෙන යම් යම් බලතල මේ පළාත් සභාවට අපි ගන්න ඕනෑය කියලා. මම හිතන්නේ එහෙම නොගත්තත් අධීක්ෂණය කිරීමේ බලතල මේ පළාත් සභාවට තිබෙන නිසා, පළාත් පාලන ආයතනවල වන මේ කටයුතු පිළිබඳව අධීක්ෂණය කිරීමේ සෘජු බලයක් තිබෙන නිසා මේ යෝජනාව සක්‍රීය යෝජනාවක් බවට පරිවර්තනය කරන්න පුළුවන්. එහෙම නම් අර කලින් යෝජනාව හමස් පෙට්ටියට ගියා වාගේ සිදු කරන්නේ නැතිව, මේ වර්ෂයේදී අපට පුළුවන් ප්‍රධාන අමාත්‍යාංශය හරහා මේ යෝජනාව පිළිබඳව කථා කරලා - තමුන්නාන්සේත් මම හිතන්නේ පළාත් පාලන ආයතන පිළිබඳව දැනීමක් තිබෙන මන්ත්‍රීවරයෙක්. උප සභාපතිවරයෙක් හැටියට - මෙතැන ඉන්නවා අපේ ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා. පළාත් පාලන ආයතනවල සභාපතිකම් දරපු, බොහොම දැනීමක් තිබුණු ඇමතිවරයෙක්. ඉතින් ඒ නිසා අමාත්‍ය මණ්ඩලය සාකච්ඡා කරලා මේ යෝජනාව සක්‍රීය යෝජනාවක් බවට මේ වර්ෂයේම පත් කරන්න වාසනා මහිමය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.06 ]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මමත් පළාත් පාලන ආයතනයක හිටපු මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ මුදල් දෙනවාට වැඩිය, මීට ඉස්සෙල්ලා කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ මේ පළාත් පාලන ආයතන අධීක්ෂණය කරන්න පළාත් සභාවට තිබෙන ඒ බලය යම් ප්‍රමාණයක් අපට පවරා ගන්නට ඕනෑ. මොකද හේතුව, දැන් පළාත් පාලන ආයතනවල පාරවල් ගත්තොත් හැමදාම හදනවා. ඒ වාගේම හැමදාම කැඩෙනවා. මම හිතන්නේ හොඳට හදන්නේ නැති හින්දා වෙන්න පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

50% යි වැඩේ වෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ නිසා වෙන්න පුළුවන්. නමුත් මම දැක්කා ඊට වඩා දෙයක්. මොකද, මේ පළාත් පාලන ආයතනවල පාරවල් අඩි 10 නම් වැටේ ඉඳන් පාර තිබෙන්නේ. අද වන කොට ඒ පළාත් පාලන ආයතනවල පාරවල්වල දෙපැත්තේ ඉන්න මිනිස්සු වැටෙන්ම තාප්පය ගහන්න පුරුදු වෙලා. වැටෙන්ම තාප්පය ගහන්න පුරුදු වුණාම ඒ පළාත් පාලන ආයතනය කට වහගෙන ඉන්නවා. නමුත් පළාත් පාලන නීතියේ තිබෙනවා පළාත් පාලන පාරක පාරේ මධ්‍යයේ ඉඳන් අඩි 10 කින් එහා තමයි තාවකාලික ඉදි කිරීමක් වුණත් කරන්න පුළුවන් කියලා. කිසිම පළාත් පාලන ආයතනයක් ඡන්දය කැඩේවි, මනාපය කැඩේවි කියලා මේ නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ. එතකොට අඩි දහයෙන් දෙගොල්ලෝම තාප්පය ගැහුවාම පස්සේ දෙපැත්තෙන්ම - දැන් ගහන්නේ වැටෙන්මයි. අර ප්‍රමාණය තියන්නේ නැහැ. වාහන යන්නයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, එක් එක් ප්‍රදේශවලට ඔය යෝජනාව සංශෝධනය වෙලා තිබෙන්නේ. අඩි දහයම නොවෙයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. සමහර අවස්ථාවල වෙන්න ඇති. නමුත් පොදුවේ ගත්තාම අඩි 10 ක් තිබෙන්න ඕනෑ පාර මැද ඉඳන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**

Hon. Sirikamal Felician De Silva

ඒ පාරේ අයිතිය අනුව තමයි ඒක තීරණය වෙන්නේ. ප්‍රධාන මාර්ගයක නම් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මධ්‍ය ලක්ෂයේ ඉඳලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මධ්‍ය ලක්ෂයේ ඉඳලා. මම දැන් උදාහරණයක් විධියට කටාන ප්‍රාදේශීය සභාව ගත්තොත්. කටාන ප්‍රාදේශීය සභාවට අයිති පාරවල්වල, පාරේ මධ්‍ය ලක්ෂයේ ඉඳන් අඩි 10 කින් තමයි ඉදි කරන්න පුළුවන්. අද දැන් පුරුදු වෙලා තිබෙන්නේ, තිබෙන වැටෙන්ම ඉදි කරන්න. එතකොට අඩි 10 යි පාරට තිබෙන්නේ. එතකොට තාර දාන්නෙත් මේ අඩි දහයේ. කාණු දාන්න ඕනෑත් මේ අඩි දහයේ. වතුර බහින්න ඕනෑත් මේ අඩි දහයේ තමයි. එතකොට කාණු පද්ධතියක් තියන්න බැහැ. එහෙම නැත්නම් පාරේ වෙනත් ලයින් එකක්, වතුර ලයින් එකක් නැත්නම් ටෙලිෆෝන් ලයින් එක යවන්න බැහැ. කඩන්නේ පාර. හැමදාම

[ ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා ]

පාර හදනවා. හැමදාම පාර කඩනවා. මෙන්න මේ නිසා හැමදාම පාර අබලන් තත්ත්වයෙන් පවතිනවා. නමුත් රටේ පාරවල් ගත්තාම 80% ක් හදලා තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්  පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පස් අදින වාහන යනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හැම එකම.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. දැන් පස් අදින වාහන ගියාම යන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

යන්න බැහැ. ඊළඟට ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරන්නේ. මේ පාරවල් නඩත්තු කරන්න සල්ලි දෙනවා වාගේම පළාත් පාලන ආයතනවලට අපේ දැඩි නිරීක්ෂණයක් තිබෙන්න ඕනෑ, මේ ඉදි කිරීම් කරන කොට අවම සීමාව තියන්න කියලා. එහෙම නැත්නම් අපි සල්ලි දෙනවා. නමුත් මේ අවිධිමත් ආකාරයට සංවර්ධනය කළොත් හැමදාම කැඩෙනවා. මේ වන කොට තවත් අවුරුදු දහයකින් පහළොවකින් මගේ දැනීමේ හැටියට නම් - මොකද, අපේ තාත්තාට තිබුණේ ෆුට් සයිකලයක්. අද හැමෝටම වාහන තිබෙනවා. මෝටර් සයිකල් තිබෙනවා. තව අවුරුදු දහයකින් පහළොවකින් ඔක්කෝම වාහනයක් ගනියි. වාහන දෙකක් කොහොමද මේ අඩි දහයේ  මාරු වෙන්නේ. අනාගතය වෙද්දී මහා පාරේ මිනිස්සු ගහ ගන්නවා. රිවස් කරන මිනිහෙක් නැහැ. කවුරුත් පස්සට ගන්නේ නැහැ. පාර අඩි දහයයි. වාහන දෙකක් ගත්තාම රිවස් කරන්න විධියක් නැහැ. යන්න බැහැ. ඒ නිසා -

**ගරු යූ. ජෝර්  පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රාදේශීය සභාවල සභාපතිවරු බයිසිකල්වල ගියේ ඒ කාලේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම යෝජනා කරන්නේ මේ මුදල් දෙනවා වාගේම - හොඳ යෝජනාවක්. අපි අධීක්ෂණය කළ යුතුයි. මේ පළාත් පාලන ආයතනවල මාර්ගවල ඉදි කිරීම් කරන කොට ඒ ඉදි කිරීම් අනිවාර්යයෙන්ම නීත්‍යානුකූල කරන්න ඕනෑ. එහෙම නොවුණොත් අනාගතය වන විට මේ පාරවල්වල වාහන යන්න බැරි තත්ත්වයක් උදා වෙනවා. සංවර්ධනය කරන්න බැහැ. කාණුවක් යන්න බැහැ. වතුර යන්න විධියක් නැහැ. ඒ නිසා මගේ ඉල්ලීම - ඒ මන්ත්‍රීතුමාගේ හොඳ යෝජනාවක්. ඒක ක්‍රියාත්මක කරන ගමන්ම අපි පළාත් සභාව වශයෙන් අධීක්ෂණය කරන්න ඕනෑ, පළාත් පාලන ආයතනවල මේ ඉදිකිරීම් ගැන. මාර්ගය යාබද හරියාකාරව වෙනවාද කියන එක ගැන. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු එම්.එම්.එම්. අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාව වෙනුවෙන් දෙපාර්ශවයේම ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම වටිනා වැදගත් කාලෝචිත අදහස් රැසක් මේ සභාවට ඉදිරිපත් කළා. යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමාට විනාඩි දෙකක, තුනක විතර අවස්ථාවක් දෙනවා. පිළිතුරු කථාව සඳහා.

[ අ.භා. 12.11 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මාගේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරපු යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා, අනන්ද හරිස්චන්ද්‍ර මැතිතුමා මේ යෝජනාව පිළිබඳව ලබා දුන් අදහස් අනුව අද අපි දකින්නේ, මේ යෝජනාව අපේ බස්නාහිර පළාත් සභාවේ ඉතාමත් වැදගත්

කාලෝචිත යෝජනාවක් ලෙසටයි. එහෙම අපි සලකනවා. ඒකට ප්‍රධාන හේතුව බස්නාහිර පළාත් සභාව සීඝ්‍රයෙන් සංවර්ධනය වන පළාත් සභාවක්. මේ පළාත් සභාව තුළ පළාත් පාලන ආයතනවල ජනගහනය දවසින් දවස වැඩි වෙනවා. වැඩි වීමේ අවශ්‍යතාවය තුළ, කාර්මීකරණය වැඩි වීම තුළ මම හිතන්නේ මේ පළාත් පාලන ආයතනවල මාර්ග පද්ධතිය පිළිබඳව එදාට වඩා අද විශාල වශයෙන් වගකීමක් තිබෙනවා. ඒ වගකීම තුළ පළාත් පාලන ආයතනවලට හුදෙකලා නොවී ඔවුන්ගේ ඒ දෛනික රාජකාරී කටයුතු සඳහා පළාත් සභාවේ මැදිහත්වීමක් ලබා දෙමින්, පළාත් සභාවේ සහයෝගයක් ලබා දෙමින් පළාත් සභාවේ අධීක්ෂණයක් ලබා දෙමින්, ඒ පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාවය වැඩි කිරීමට මෙය හොඳ යෝජනාවක් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව තුළ අපි අපේක්ෂා කරන්නේ, ප්‍රාදේශීය සභාවෙන් කුණු ට්‍රැක්ටරය පිටත් වෙනවා වාගේම, ප්‍රාදේශීය සභාවේ ප්‍රීමික්ස් ට්‍රැක්ටරයක් පිටත්වීමේ යුගයක් උදා කර ගැනීමයි. ඒක තමයි අපි මේ යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ. එම නිසා ප්‍රාදේශීය සභාවෙන් කුණු ට්‍රැක්ටරය පිටත් වෙනවා හා සමාන විධියට ප්‍රාදේශීය සභාවෙන් ප්‍රීමික්ස් ට්‍රැක්ටරය ද පිටත් වෙලා මාර්ගවල තිබෙන්නා වූ අබලන් වූ තැන් මකා දමමින් ඒ මාර්ග ජනතාවට සුදුසු පරිදි, ජනතාවට හිතවාදී පරිදි පාවිච්චි කරන්න පුළුවන් මාර්ග පද්ධතියක් සකස් කර ගැනීමට දෛනික මාර්ග නඩත්තු කටයුතු කාර්යක්ෂම කර ගැනීමට මේ යෝජනාව ඉවහල් වෙන්න ඕනෑය කියන එක තමයි අපේ බලාපොරොත්තුව. (බාධා කිරීමක්) ඒ නිසා අපි බලාපොරොත්තු වන පරිදි ප්‍රාදේශිය සභාවේ ඒ කාර්යක්ෂමතාවය පිළිබඳව, මාර්ගවල තිබෙන්නා වූ අඩුපාඩුකම් පිළිබඳව කථා කිරීමේදී, ඒ මාර්ගයන් හි නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාව යම් කිසි මුදලක් වෙන් කරලා, ඒ නඩත්තු කටයුතු ඒකක ස්ථාපනය කරලා ඒවා සඳහා යම්කිසි අධීක්ෂණයක් පළාත් සභාව තුළින් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව පවතිනවා. මම හිතන්නේ, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු මෙන්ම, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් මේ සඳහා සහයෝගය ප්‍රකාශ කරමින් මේ යෝජනාව ජනතාවට හිතකර, ජනතාවට වැඩදායී යෝජනාවක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙනු ඇතැයි ප්‍රකාශ කරමින් මගේ පිළිතුරු කථාව මෙයින් නිම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අද දවසේ විශේෂයෙන් එම්.එම්.එම්. අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා (බාධා කිරීම්) බොහොම ලොකු උනන්දුවකින්, බොහොම කැපවීමකින් තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. පෞද්ගලිකව මා දැනුවත් වී සිටිනවා, එතුමා හොඳ විධායක ඉංජිනේරුවරයෙක්. විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ හොඳ සේවාවක් කරපු කෙනෙක්. ඒ නිසා කලින් අනුර හේමපාල හිටපු ගරු මන්ත්‍රීතුමාත් මේ ආශ්‍රිතවම යෝජනාවක් ඉදිරිපත් කළා කියලා මගේ මතකයත් අලුත් වුණා. මම දැකපු හොඳ දෙයක් තමයි මේ ප්‍රාදේශීය සභාවෙන් පළාත් පාලන ආයතනයෙන් කුණු ට්‍රැක්ටරයක් පිටත් වෙනවා වාගේම, ප්‍රීමික්ස් ඒ කියන්නේ පෙරමුසු ට්‍රැක්ටරයක් පිටත් වන එකත් නුදුරු අනාගතයේදී සිද්ධ වෙන්න ඕනෑය කියලා. ඒ තරම් දැනුමක් එතුමා සතුව තියෙනවා. ඒ වාගේම මමත් එතුමාගේ ඊළඟ අදහසට එකඟයි. මුළු සභාවම එකඟයි. අධීක්ෂණ ඒකකයක් පිහිටුවීම පිළිබඳව. මෙය වෙන්න ඕනෑ. අධීක්ෂණය කිරීමේ වාහනයකුත් ඒ පිටුපස්සෙන් යන්න ඕනෑ.

අද මේ රටේ මහ විශාල වෙහෙසක් ජනාධිපතිතුමා, රජය දරනවා රටේ මාර්ග පද්ධතිය හදලා දෙන්න. පළාත් පාලන ආයතනවලට බරපතළ චෝදනා තියෙනවා. ඒක කියන්න ඕනෑ. ඒ නිසා අධීක්ෂණ ඒකකයක් හදලා හොරකම් කරන, වංචා කරන, මේ මාර්ග පද්ධතිවලින් ගසා කන සභාපතිවරු සැහෙන ප්‍රමාණයක් ඉන්නවා. මට දැනගන්න ලැබුණා බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවලට මාසෙකට පැමිණිලි තුන්සියයක් එනවා කියලා. අපි ලැජ්ජා වෙන්න ඕනෑ. විමර්ශන ඒකකයක් හදන්න කියලත් මූලාසනය හැටියට මතක් කරමින් මේ යෝජනාව සම්බන්ධව සභාවේ එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ එකඟතාවය සතුටින් පළ වී තිබෙනවා. විපක්ෂයේ සංවිධායකතුමා තමයි මේක ස්ථිර කරනු ලැබුවේ. ඒ නිසා මෙම යෝජනාව සභා සම්මත වූ බව සතුටින් ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අද දවසේ පෞද්ගලික මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා යටතේ මීළඟට නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව. අධ්‍යාපනය සම්බන්ධව එතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මම එතුමාට ඇරයුම් කර සිටිනවා, යෝජනාව ඉදිරිපත් කරන ලෙස.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගණ පූරණය පිළිබඳ විමසීමක් කරනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එහෙම බැහැ නේ? කරුණාකර වාඩි වෙන්න.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මේක මගේ අයිතිය.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අයිති වෙන කතන්දරයක්. මේක කඩාකප්පල් කරන්න සාකච්ඡා කරලා වෙන වැඩ පිළිවෙළක් අරන් ගිහිල්ලා -

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, ගණ පූරණය විමසනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ මාතෘකාවට මුහුණ දෙන්න බැරුව ගණ පූරණය ගෙනාවා. අනික් යෝජනා වාගේ මේකට මුහුණ දෙන්න කෝ.

[සභාවේ ඝෝෂා]

ගණ පූරණය ආණ්ඩු පක්ෂය තියා ගන්න එපායැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මුලින්ම අසුන් ගන්න. ගරු ඇමතිතුමාත් සමාවෙලා අසුන් ගන්න.

**ගරු සුනිල් ජයමිණි -** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාව ගෙනාපු වෙලාවේ ගණ පූරණය සභාවේ තිබුණා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ කොහේද තිබුණේ ගණ පූරණයක්.

**ගරු සුනිල් ජයමිණි -** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

දහයාමාරට යෝජනාව සභා සම්මත කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ගරු මන්ත්‍රීතුමා අසුන් ගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

යෝජනාව ගේන්න ඉස්සරවෙලා අපි දන්නවා මේ ගොල්ලෝ ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය ගේනවා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සභානායකතුමා මට මූලාසනය හැටියට කටයුතු කරන්න වෙන්නේ රීති යටතේ. ඒ නිසා සීනුව නාද කරන්න කියලා මම නියෝග කර සිටිනවා.

[සභාවේ ඝෝෂා]

කලින් මතක් කළා වාගේ රීති ප්‍රකාරව ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා 26 දෙනෙක් මේ මොහොතේ මේ සභාවේ රැස්ව සිටිනවා. විශේෂයෙන් ගන පූරණය සම්බන්ධව පැන නැගුනු යෝජනාවත් එක්කයි මූලාසනයට මෙම තීන්දුවට යන්න වුණේ. කෙසේ වෙතත් අන්තර්භවයේ ගන්ධබ්බයෙක් නොවී යළි ඊළඟ සභා වාරයේ මේ යෝජනාවට ජීවය දෙන්නට පුළුවන්කමක් ලැබේවි කියලා මූලාසනය විශ්වාස කරනවා. ඒ අනුව,

# 12 (1) රීතිය යටතේ කල් තැබීම
ADJOURNMENT UNDER RULE 12 (1)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.30 ට, 2013 මාර්තු මස 19 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.30 p.m till 9.30 a.m. on 19.03.2013*